2021 මැයි
03 කාණ්ඩය 02 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට





# ඉක්මනට එන්න, හුස්මටික ඉවරවෙයි!

"හොඳට අල්ලගනින්. අතැරෙයි ඕක උඹ අතින්. එහෙම උනොත් ඔක්කොම සුන්."

"හරි මචං යමු, මේක ටිකක් බර වැඩියි."

නිදහසේ මිලක් නොගෙවා ගත්ත එකම දේ! අද අපි පොළිම්වල පොරකකා, මිලට ගන්නවා කියලා හිතන්නවත් පුළුවන්ද?

කොරෝනා වසංගතයත් සමඟින් ඔක්සිජන් ටැංකි කර තබාගත් මිනිසුන්ගේ දර්ශන අද ඉන්දියාවේ සුලබ දසුනක්. රේල් පීලි මත දුවන දුම්රියේ සිට කුලී ත්‍රිරෝද රථ හා යතුරුපැදි දක්වාම අද හුස්ම රැගත් සිලින්ඩරයි පටවාගෙන යන්නේ. තැන තැන වැටි වැටී මියැදෙන මිනිසුන්, දර කොටන් තුළ ඇවිලෙන මළකඳන්, හුස්ම ගන්නට පිච්චියක් අතේ නැතිව වැළපෙන මිනිසුන්, පිච්චිය අතේ ඇතිව පොළිමේ පොරකන මිනිසුන් අද මෙවැනි ඉරණමක් අත්කරගත්තේ කොරෝනා නිසා පමණක්ද? නැතහොත් මෙය විවිධ වෙස් ගෙන අප ජීවිත ඩැහැගන්නා රකුසු ධනවාදයේම ප්‍රතිඵලයක් නොවේද?

# මරණයේදීත් සටන අත්නොහළ අසාහය මිනිසා

# උපතිස්ස ගමනායක



ඔහුට අනුව විප්ලවවාදියෙකුට සිය ජීවිතය තුළ අවස්ථා තුනක් ඇත.

"විප්ලවවාදියා එක්කො අරගල භූමියේ සිටිය යුතුය. නැතහොත් ඔහු සිපිරි ගෙයක සිටිය යුතුය. අරගල භූමියක හෝ සිපිරි ගෙයක නොසිටින විප්ලවවාදියා ජීවතුන් අතරද නොසිටිය යුතුය"....

ඔහුද ඔහුගේ වචනවල පරිසමාප්ත අර්ථයෙන්ම විප්ලවවාදියෙකි. සුවහසක් දුක්විඳින ජනතාවට විමුක්තිය උදාකරනුවස්, කටෝර ගිරි දුර්ගවලින් පිරි විප්ලවීය මාවතම තෝරාගත් සැබෑ තරුණයෙකි. සිය උත්තුංග අරමුණ සාක්ෂාත්කරගනු වස් දිවිහිමියෙන් කැපවුණ අසාහය මිනිසෙකි. ඔහු නමින් උපතිස්ස ගමනායකයි....

යහපත් සමාජයක් දිනාගැනීම වෙනුවෙන් කළ 1971 අප්‍රේල් අරගලයට උපතිස්ස ගමනායක සහෝදරයා සම්බන්ධ වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ දෙවන වසර සිසුවෙකු ලෙසය. ඒ වනවිට යන්තම් අවුරුදු 23ක තරුණයෙකු වූ ඔහු එහිදී සිරගත නොවූවද, 1973දී ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක කර්තව්‍යයක් අතරතුරදී ත්‍යාග ලබන්නේ වසර ගණනක සිර දඬුවමකි.. පසුව ඔහුගේ සටන්බිම වූයේ සිරකඳවුරය. එහිදී පක්ෂයේ සංවිධාන කටයුතුවලට දායක වූ අතර 1975 සිරගෙ දරදී ගොඩනැගූ තාවකාලික මධ්‍යම කමිටුවේද සාමාජිකයෙක් විය. 1977දී සිරදිවිය අවසන් කර ආ ඔහු තෝරාගන්නේ උපාධිය වෙනුවට සටන්බිමය..

ඒ අනුව අතිදක්ෂ පක්ෂ ක්‍රියාකාරිකයෙකු ලෙස තම ගමන් මග සනිටුහන් කළ උපතිස්ස ගමනායකයන්, ලාංකීය නිර්ධනීන්ගේ පක්ෂය; ජනතා විමුක්ති පෙරමුණ යළි දෙපයින් සිටුවීමට අනේකවිධ කැපකිරීම් කළ නියමුවෙකි. ඔහු අතිදක්ෂ කථිකයෙකි. 1977දී පක්ෂයේ නිල නාමය තහවුරු කිරීමට පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවටද සහභාගි වූ ඔහු 1977දී හයිඩ් පිටියේහි පැවති පක්ෂයේ පළමු රැස්වීමෙහි ප්‍රධාන කතිකයාද විය. රැස්වීම පැවැත්වීම සඳහා පෝස්ටර ඇලවීමේ සිට දිවා රෑ නොබලා ඔහු තම ශ්‍රමය කැපකළේ නායකත්වය යන්න ක්‍රියාවෙන්ම ඔප්පුකරමිනි. 1978දී සමාජවාදී කම්කරු සංගමය ගොඩනැගීමටද අනුපමේය දායකත්වයක් දැක්වූ ඔහු එහි ලේකම් ලෙස කම්කරුවන්ට මග පෙන්වූයේය.

ගමනායක සහෝදරයා 1980 අතුරු මැතිවරණයට ආනමඩුව බලප්‍රදේශය සඳහාද, 1987 සංවර්ධන සභා චන්දයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන අපේක්ෂකයා ලෙසද තරඟ කළේය.. සිය සහෝදර සගයින් සමඟ ලෙංගතුව හා අප්‍රිහිත ධෛර්යයෙන් යුතුව පක්ෂය ගොඩනැංවීම සඳහා සිය දහදිය හෙළුවේය. 1983දී එවකට ජනපති ජේ.ආර්.ජයවර්ධන විසින් ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරද්දීත් ගමනායකයන් සටනට බියේ පලාගියේ නැත. අතිදුෂ්කර කාලවකවානුවකදී පවා ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් ලෙස කටයුතු කරමින් සියලු අභියෝගයන්ට අභීතව මුහුණදෙමින් ගමින් ගම, රට පුරා සැරිසරමින් දේශපාලන කටයුතුවල නිරතවූයේ ඔහුගේ සංවිධාන ශක්තිය මොනවට විදහාපාමිනි. "විජේවීර මොළකාරයා-ගමනායක වැඩකාරයා"යනුවෙන් එදා හඳුන්වන්නට ඇත්තේද එබැවිනි.

නිර්ධනීන් විසින් ධනපති පාලකයින්ට විරුද්ධව ගෙන යන සෑම සටනකදී මෙන්ම එහිදීද ඔවුන්ට මුහුණදීමට සිදුවූ මර්ධනය හමුවේ උපතිස්ස ගමනායක සහෝදරයා 1989දී අත්අඩංගුවට ගනු ලැබීය. නේකවිධ වද බන්ධන පෙනි පෙනී තිබුණද, ගමනායක සහෝදරයා මරණයට පත්වූයේ දීනයෙකු ලෙස නොවේ!. දණින් වැටී පරාජය වනු වෙනුවට ඔහු තම සතුරා ඉදිරියේ තම පක්ෂය, සටන්සගයන් හෝ තම ආත්මය පාවානොදුන්නේ මරණය අභියසදීත් සැබෑ විප්ලවවාදියෙකුගේ නිර්භය හදවතක බල පෙන්වමිනි...

මිනිසෙකුට වරක් පමණක් ලැබෙනා වටිනාම වස්තුව වන ජීවිතය ගිලිහී යන අවසන් තත්පරයේදී පවා සිය මව්බිම වෙනුවෙන් සටන්කළ ඒ උතුම් මිනිසා; උපතිස්ස ගමනායක සහෝදරයාගේ සිරුර 1989 නොවැම්බර් මස 12වැනි දින කැබලි කළද ඒ ධනවාදී ම්ලේච්ඡ ඝාතකයන්ට කිසිවිටෙක ඔහුගේ හදවතේ අභිප්‍රායට අංශුමාත්‍රයකුදු වූ හානියක් කිරීමට නොහැකිවන්නට ඇත..මරණයෙන් මතුවටද ඔහු ගිය මග ඔස්සේ යමින් දුක්විඳින මිනිසුන්ගේ හෙට දිනය සුවපත්කරන සමාජවාදී සමාජයක් ගොඩනැගීමෙහිලා නැගෙන මාවතේ ඔහු නමින් දහසක් රතු මල් පූදිනු නිසැකය..!!....

# උපාධිධාරීන්ට රැකියා ලබාදීමට නිශ්චිත වැඩපිළිවෙළක් තිබිය යුතුයි.



*රැකියා විරහිත උපාධිධාරී ඒකබද්ධ මධ්‍යස්ථානයේ කැඳවුම්කරු*
***මහේෂ් අබේපිටිය***

## රැකියා විරහිත උපාධිධාරී ඒකබද්ධ මධ්‍යස්ථානය ගොඩනැගුනේ කුමක් අරබයා ද?

ඉතිහාසය පුරාවටම ලංකාව තුළ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සහ ලබාගැනීම සඳහා ආණ්ඩුවලට වැඩපිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසාම එය සරල සහ සාමකාමී එකක් වුණේ නැහැ. හැමදාම උපාධිධාරීන්ට ඒ වෙනුවෙන් සටන් කරන්න සිදු වුණා. අවුරුදු හතරක් පහක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමාකරලා එන උපාධිධාරියාට තවත් අවුරුදු කිහිපයක් රැකියා අපේක්ෂාවෙන් පෝලිම්වල ඉන්නවෙලා තියෙනවා. උපාධිධාරීන්ගේ දැනුම රටේ සංවර්ධනය සඳහා දායක කිරීමට ආණ්ඩුවලට නොහැකිවීම නිසා සමාජ අර්බුදයක් නිර්මාණය වෙලා. මේ නිසා ඉතිහාසය පුරාවට අරගල නිර්මාණය වුණා. මෙලෙස ඇරඹි දැවැන්ත සටනක් ලෙස 2004 - 2005 කාලවකවානුව තුළ උපාධිධාරීන් 47,000කට රැකියා ලබාගැනීම වෙනුවෙන් චන්දන සූරියආරච්චි සහෝදරයාගේ මැදිහත්වීමෙන් ආරම්භ කරන ලද සටන හඳුන්වන්න පුළුවන්. එම සටන ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරීන් ලෙස සංවිධානගත සටනක් අද දක්වාම තීව්‍ර වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබෙනවා. ඒ අනුව රැකියා විරහිත උපාධිධාරී ඒකාබද්ධ මධ්‍යස්ථානය ඓතිහාසික සටන්වල ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූවක්. අනාගතයේදී උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ නිශ්චිත වැඩපිළිවෙලක් සෑදීමට ප්‍රතිපත්තිමය සංශෝධනයක් සිදුකිරීම ඉලක්ක කර ගත් සංවිධානයක් ලෙස හඳුන්වන්න පුළුවන්. එපමණක් නොව උපාධිධාරීන්ට රැකියා ලබාදීම සහ රැකියා ලබාගැනීමේදී සිදුවන අසාධාරණකම් පිළිබඳ මැදිහත් වෙමින් සාකච්ඡා මගින් හෝ එසේ නොහැකි නම් සංවිධානාත්මක අරගල මගින් හෝ ජයග්‍රහණය කිරීම වෙනුවෙන් මැදිහත් වන සංවිධානයක්. එය හුදකලා සංවිධානයක් නොවේ. ඒ වටා සංවිධාන රාශියක් එකතුව සිටිනවා.

## උපාධිධාරීන්ට රැකියා ලබාදීම ආණ්ඩුවේ වගකීමක් ලෙස ඔබ දකින්නේ ඇයි?

මේ ප්‍රශ්නය සමාජයෙන් නිතර ඇසෙන ප්‍රශ්නයක්. එය ආණ්ඩුවේ වගකීමක් නොවන බවට ආණ්ඩු හිතවාදීන් සමාජය තුළ පතුරවමින් සිටින මතවාදයක්. රටක සංවර්ධන ක්‍රියාවලියට දියුණු ශ්‍රමිකයින් අවශ්‍යයි. අපේ රටේ දරුවෙකුට අවුරුදු 13ක පාසල් අධ්‍යාපනය ලබාදීමට රජය විශාල මුදලක් දරනවා. ඉන් විශ්වවිද්‍යාල අධ්‍යාපන ලබන සිසුවකුට දළ වශයෙන් ලක්ෂ 5කට වැඩි මුදලක් වියදම් කරනවා. එවැනි විශාල මුදලක් වියදම් කර නිර්මාණය කරගන්නා දියුණු ශ්‍රමිකයාගේ දැනුම රටේ සංවර්ධනයට අවශ්‍ය පරිදි දායක කරගැනීම ආණ්ඩු සතු වගකීමක්. ඒ වෙනුවෙන් වැඩපිළිවෙළයන්, ප්‍රතිපත්තිමය තීන්දු ගත යුත්තේ ආණ්ඩු විසින්. ජනතා බදු මුදල් වියදම් කර බිහිකරන උපාධිධාරියා නිසි ලෙස රටේ සංවර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් යොදාගැනීම ආණ්ඩු සතු වගකීමක්.

## උපාධිධාරීන් පිළිබඳ සමාජයේ තියෙන ප්‍රතිචාර එතරම් යහපත් නැහැ. ඒ පිළිබඳ ඔබේ අදහස කුමක් ද?

ආණ්ඩු විසින් සමාජය තුළ උපාධිධාරීන්ගේ රැකියා ගැටළුව පිළිබඳ දුර්මතයන් පතුරවමින් සිටිනවා. උපාධිධාරීන් පෞද්ගලික අංශයේ රැකියා තිබියදී පිං පඩි ගැනීම සඳහා රජයේ රැකියා ඉල්ලමින් සිටින බව ඉන් එකක්. අප දන්නා තරමින් කිසිදු උපාධිධාරියෙක් රජයේ රැකියාවක් ලැබෙන තුරු අත් බැඳන් ගෙදරට වෙලා සිටින්නේ නැහැ. ඔවුන් කුමන හෝ රැකියාවක නියැලෙනවා. මහබැංකු වාර්තාවන්ට අනුව ලංකාවේ අවුරුද්දකට පෞද්ගලික අංශයේ 60000ක් සහ රාජ්‍ය අංශයේ 40000ක් වශයෙන් රැකියා ලක්ෂයක් උත්පාදනය වේ.

උපාධිධාරීන්ට පෞද්ගලික අංශයේ රැකියා ලබාදිය හැකි නම් ඒවා කුමන ක්ෂේත්‍රවල රැකියාද? අවුරුද්දකට එවැනි රැකියා කොපමණ නිර්මාණය වනවාද? රජයක් ලෙස ආණ්ඩුව පෞද්ගලික අංශයේ රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතුයි.

අනෙක් දුර්මතය තමයි කලා උපාධි අවශ්‍ය නොවන බවත් තාක්ෂණික හා වෘත්තීය උපාධි හා පාඨමාලා පමණක් ප්‍රමාණවත් බවත්. සියළු උපාධිවල විෂය පථය වෘත්තීමය හැඩයකට වෙනස් විය යුතු බව අප විශ්වාස කරනවා සහ ඒ වෙනුවෙන් අදාල ආයතන සමඟ අප සාකච්ඡාවක නිරත වී සිටිනවා. රටක වෘත්තීයන්ට පමණක් ඉලක්ක කර ගත් අධ්‍යාපනයක් ලබාදීම මගින් රටේ සංවර්ධනය පමණක් නොව මානුශීය බැඳීම් පවා බිඳවැටීමට ලක්වනවා. එම නිසා ශාස්ත්‍රීය සහ වෘත්තීමය යන ක්ෂේත්‍ර දෙකේම සංකලනයක් මෙම විෂයන් තුළ තිබිය යුතු බව අප විශ්වාස කරනවා.

වැදගත්ම කරුණ තමයි මෙරටේ විශ්වවිද්‍යාලවල වැඩිම අවස්ථාවක් තියෙන්නේ කලා උපාධි සඳහා. ඒ නිසා කලා උපාධි හදාරන පිරිස වැඩියි. අනෙක් උපාධි හැදෑරීම සඳහා වැඩි අවස්ථාවක් ලැබේ නම් කලා විෂය හදාරන බොහෝදෙනා වෙනත් වෘත්තීමය උපාධි හදාරන්න ආරම්භ කරාවි. එසේම මෙවැනි මත ගෙන යන්නන්ගෙන් අපි අහන්න කැමතියි තාක්ෂණ විෂයන් හැදෑරූ කොපමණ පිරිසක් රැකියා විරහිතව සිටිනවාද යන්න. ඔවුන් වෙනුවෙන් ඇති වැඩපිළිවෙළවල් මොනවාද යන්න.

## පසුගිය කාලය තුළ ඔබ සංවිධානය අත්පත් කරගත් ජයග්‍රහණ මොනවා ද?

ජයග්‍රහණ බොහෝමයක් තියෙනවා. ඒ අතරින් මුලින්ම චන්දන සූරියආරච්චි සහෝදරයාගේ මැදිහත්වීමෙන් 2004 - 2005 කාලවකවානුවේ උපාධිධාරීන් 47000කට රැකියා ලබාදීම වෙනුවෙන් ඇරඹූ සටන ජයග්‍රහණය කිරීමට හැකි වුණා. ඉන් පසුව 2012 මාර්තු මාසය වන තුරු උපාධිධාරීන්ට රැකියා ලබාදීම වෙනුවෙන් අප ගෙන ගිය සටනින් උපාධීධාරීන් 50000කට පමණ රැකියා ලබාදීමට හැකියාව ලැබුණා. පසුව 2012 සිට 2019 දක්වා උපාධිධාරීන්ට රැකියා ලබාදීම මේ ආණ්ඩු විසින් අත්හිටවනු ලැබුවා. අවුරුදු හතක කාලයක් රැකියා නොදී සිටියදී අපි ඒ කාලය පුරාවටම ඒ වෙනුවෙන් සටන් කරා. අපේ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේදී යහපාලන ආණ්ඩුවෙන් උපාධිධාරීන් 60000ක් බඳවා ගැනීමට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න සිදුවුණා. 2019 අවසන් වන විට ඉන් 20000 බඳවාගැනීමට ආණ්ඩුවට සිදුවුණා. 2020 අලුත් ආණ්ඩුව පත්වුණායින් අනතුරුව උපාධිධාරීන්ට රැකියාදීම කල්මැරීමට සූදානම් වුණා. ඊට එරෙහිව සිදු කරන ලද අරගල නිසා තවත් උපාධීධාරීන් 58000කට රැකියා ලබාදීම අපේ මැදිහත්වීමෙන් සිදුකිරීමට හැකිවුණා.

මේ වන විට 2019 වසරේ රැකියා නොලැබුණු තවත් උපාධිධාරීන් පිරිසක් සිටිනවා. ඔවුන්ට රැකියා ලබාදීම වෙනුවෙන් සටනට අපි මැදිහත් වෙමින් සිටිනවා. නුදුරේදී ඒ සටන අපට ජයග්‍රහණය කිරීමට හැකි වේවියි අපි විශ්වාස කරනවා. එපමණක් නෙවෙයි, මෙම සටන ඇතුළත උපාධිධාරීන් වර්ග කර මෙම සටන දියාරු කිරීමට නොයෙක් පාර්ශව උත්සහ ගත්තා. මුලින්ම ඔවුන් අභ්‍යන්තර, බාහිර ලෙස සහ ࢭහඃ, විදෙස් විශ්වවිද්‍යාල, පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් අය ලෙස වර්ග කරනු ලැබුවා. එම භේදයන්ට එරෙහිව සටන් කරමින් සියලුදෙනා උපාධිධාරීන් ලෙස සළකා කටයුතු කරන ලෙස අප බලපෑම් කරා.

ඒ වගේම අවුරුදු හතක් රැකියා නොලැබීම නිසා වයස් සීමාව 35 ඉක්මවීම නිසා අසාධාරණයට ලක් වූ අය වෙනුවෙන් වයස් සීමාව අවුරුදු 40 දක්වා වැඩිකිරීම වෙනුවෙන් අපි කරපු සටන ජයග්‍රහණය කිරීමට අපට හැකියාව ලැබුණා. ඒ වගේම මෙම රැකියා ලබාදුන්නේ අවුරුදු දෙකක පුහුණු කාලයකට යටත්ව මාසෙකට රුපියල් 20000ක වැටුපකට. පුහුණු කාලය එක් අවුරුද්දකට සීමාකර පුහුණුවෙන් පසුව සේවයේ ස්ථිර කිරීමට අප කළ අරගලය සාර්ථක වුණා.

## මේ සටනේ ඉදිරි ගමන කෙසේ වේවිද?

මෙම සටන් සිදුකිරීමේදී අපට ලැබුණු අභියෝගාත්මක අත්දැකීම් අනුව මෙම සටනේ ඉදිරි ගමන බොහෝ අසීරු වන බව අපි තේරුම් අරන් සිටිනවා.

උපාධිධාරීන්ට රැකියා ලබාදීම ආණ්ඩුවට අයත් වගකීමක් නොවන බවට ආණ්ඩුව විසින් ගොඩනගන සහ ඒ අනුව යමින් ජනතාවද රවටමින් උපාධිධාරීන්ගේ සැබෑ සටන යටපත් කිරීම, විවේචනයට ලක්කිරීම ඉදිරියේ එහි යථාර්ථය ජනතාවට අවබෝධ කරදීම අපි හමුවේ ඇති අභියෝගයක්. ආණ්ඩුව සහ විවිධ කණ්ඩායම් විසින් උපාධිධාරීන් විවිධාකාරයෙන් වර්ගීකරණය කරමින් පොදුවේ සංවිධානය වීම අඩාල කරමින් සිටිනවා. එය පරාජය කිරීමත් අපට තිබෙන අභියෝගයක්.

එසේම පසුගිය අප්‍රේල් 22, 2020 උපාධිධාරීන්ට රැකියා ලබාගැනීමේ සටන අප ආරම්භ කරා. 2019 රැකියා නොලැබුණු, 45+ ගැටළුව සහ විවිධ හේතූන් නිසා රැකියා ලබාදීම ප්‍රතික්ෂේප වූ අය වෙනුවෙන් සටන ඉදිරියට ගෙන යනවා. ඒ වෙනුවෙන් අප්‍රේල් 30 දිනට යෙදුණු ප්‍රතිපත්තිමය සාකච්ඡාව කොවිඩ් තත්ත්වය හමුවේ අවලංගු කිරීමට සිදුවුණා. ඉදිරි දිනයකදී අප ඒ සාකච්ඡාව සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා.

දැනට ආණ්ඩු විසින් රැකියා ලබාදීම අත්හිටුවීම නිසා 2020 උපාධිය වලංගු උපාධිධාරීන්ට තවත් සැලකිය යුතු කාලයක් රැකියා ලබාගැනීම වෙනුවෙන් බලාසිටීමට සිදු විය හැකියි. ඒ නිසා අප වාර්ෂිකව රැකියා ලබාදීමේ වැඩපිළිවෙලක් සැකසීම සහ ඒ වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට ආණ්ඩුව සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වනවා. එසේම පළාත්, දිස්ත්‍රික්ක මට්ටමින් උපාධිධාරීන්ව සංවිධානය කරමින් ජාතික මට්මෙන් ඔවුන් මෙම සටනට පෙළගැස්සවීම වෙනුවෙන්ද අපි ක්‍රියාත්මක වෙමින් සිටිනවා.

අවසාන වශයෙන් අප උපාධිධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ මෙම සටනට ඒකාබද්ධව එකතු වන ලෙසත් තමන්ගේ රැකියා අයිතිය වෙනුවෙන් පෙළගැහෙන ලෙසත් කූඨ භේද බින්න කරන්නන්ට හසුනොවී රැකියා ලබාගැනීමට වගකීමෙන් කැපවන ලෙසත්, තවත් අය ලවා එය ඉටු කරගැනීමට නොසිට තමන්ද එක්ව, සටන්කොට සියලුදෙනාගේ අයිතිවාසිකම් ජයග්‍රහණය කිරීමට පෙළගැහෙන ලෙසත්ය.

FORWARD

සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# තාක්ෂණයේ අයිතිය වැඩකරන මිනිසුන් සහ ගැහැණුන් අතට ගනිමු!.

"හොඳ මිනිසුන් තැනිය හැක්කේ කෙසේද?" අවම වශයෙන් වසර 3000ක් පැරණි මේ ප්‍රශ්නය යුග යුග පසු කරමින් වර්තමානය හමුවටද පැමිණ තිබේ. යුගයක් නියෝජනය කිරීමට තරම් ප්‍රමාණික වූ සෑම දාර්ශනිකයෙක්ම, සෑම ආගමික ශාස්තෘවරයෙක්ම, සෑම දේශපාලකයෙක්ම මේ ප්‍රශ්නයට පිළිතුරු සෙවූහ. බොහෝ අය හොඳ මිනිසා නිමවනු හැකි යැයි තමා අදහස් කළ සමාජ, දේශපාලන ක්‍රම අත්හදා බැලූහ. සොක්‍රටීස්ද, ප්ලේටෝද, ඇරිස්ටෝටල්ද, අශෝකද, බුදුන්ද, ජේසුස්ද, මහම්මත්ද, පාරාවෝද, ඇලෙක්සැන්ඩර්ද මේ අතර වූහ. මෑත යුගය තුළ ලිබරල්වාදයද, මනෝරාජික සමාජවාදයද, ධනවාදයද, සමාජවාදයද මෙය අත්හදා බලා තිබේ. මෙහි ප්‍රවේශයන් දෙකකි. එකක් වන්නේ තනි තනි මිනිසා හොඳ මිනිසුන් බවට පත්කිරීමෙන් සියලු මිනිසුන් හොඳ මිනිසුන් කිරීමය. අනෙක් ප්‍රවේශය වන්නේ පළමුව සමාජය යහපත් කර එමගින් තනි තනි මිනිසුන් හොඳ මිනිසුන් බවට පත් කිරීමය.

වත්මන් ධනවාදී සමාජය තුළ මුළු සමාජ ක්‍රමයම පරිහානියට පත්වෙමින් තිබේ. මිනිස් ජීවිත තඹ දොයිතුවකට ගණන් නොගෙනමින් අත්හරිමින් තිබේ. එනිසා මානව සමාජය හොඳ මිනිසුන් සෙවීමට පෙළඹ තිබේ. නව මිනිසෙක් වෙනුවෙන් මුලු සමාජයම ලොව පුරා විලිරුදාවෙන් පෙලෙන යුගයක් එළැඹ තිබේ. ඩිජිටල් තාක්ෂණය කම්කරු පන්තියේ එකිනෙකා අතර වැඩි සම්බන්ධයක්ද, වැඩි අවබෝධයක්ද, වැඩි පරිපාලන හැකියාවක්ද අත්පත් කරදී තිබේ. දැවැන්ත සමාගමක් පාලනය කිරීම මයික්‍රෝ චිප් එකකට ගෙනැවිත් තිබේ.

අද ඒ චිප් එකේ අයිතිය, හැසිරවීම කිසිත් නොදත් අලස කෑදර ධනපතියන් අතේ තිබේ. කළ යුතුව ඇත්තේ එම චිප් එකෙහි අයිතිය එය නිම වූ, එය ක්‍රියාත්මක කිරීමට දන්නා වැඩකරන මිනිසුන් හා ගැහැණුන් අතට ගැනීමය. එම තාක්‍ෂණයේ අයිතිය වැඩකරන පන්තිය විසින් අත්පත් කරගැනීම කළ යුතුවම ඇත. එවිට හොඳ සමාජයක් තුළ හොඳ මිනිසුන් නිර්මාණය කිරීම කළ හැකි වනු ඇත. ලාභය හා මුදල මත සියල්ල තීරණය කරන සමාජයක් වෙනුවට මිනිස් අවශ්‍යතා හා උවමනා වෙනුවෙන් වැඩකරන මානව සමාජයක් නිර්මාණය කිරීමට තරුණයින් පෙරමුණ ගෙන කටයුතු කිරීමට කාලය එළඹ තිබේ.

**අප්‍රේල් 21**

## උන් සුදු ඇඳන් සමරයි. මුං කලු ඇඳන් සමරයි...



අප්‍රේල් 21ට පාස්කු ප්‍රහාරයට අවුරුදු 2ක් වෙලා. මේ පිළිබඳ විවිධ පුද්ගලයන් අදහස් දක්වන්න පටන් අරන්. කාදිනල්තුමා කළ ප්‍රකාශයන් පිළිබඳවත් අවිනිශ්චිතභාවයකින් තමයි බුකියේ පෝස්ට් ෂෙයාර් වුණේ. එතුමා දේශපාලකයින් රකින්න උත්සහා කරන බවක් තමයි බොහෝදෙනා කතා වුණේ. ඒවගේම 21 ප්‍රහාරය ගැන වත්මන් ආණ්ඩුවටද බරපතල විවේචනයක් බුකියේ පළවුණා. මොකද ගෝඨාබය ජනාධිපති ඡන්ද කැම්පේන් එක පටන්ගත්තේම මෙම පාස්කු ප්‍රහාරයත් සමඟම. ඔහු කිවුවේ තමන්ට බලය දෙන්න, තමුන් මෙහි වගඋත්තරකරුවන්නට දඬුවම් දෙන බවයි. නමුත් වසර දෙකක් ගතවෙලත් මොකුත් කරගන්න බැරි තත්වයට පත්වෙලා. ඒ නිසා පාස්කු ප්‍රහාරයත් දේශපාලන ගේම් එකක්ද යන සැකය බුකියේ බොහෝ පිරිස අතර පළවුණු අදහස්වලින් පෙනීයනවා. මේ 21, විවිධ දේශපාලන පක්ෂ විවිධ වැඩසටහන් කළා. පොහොට්ටුවේ දේශපාලන නායකයන් සුදු ඇදගෙනත් සමගි ජන බලවේගයේ නායකයින් කලු ඇදගෙනත් මෙම ප්‍රහාරය සිහිපත් කිරීම කළ පොස්ට් එකකට අපූරු වැකියක් බුකියේ ෂෙයාර් වුණා. "උන් සුදු ඇඳන් සමරයි. මුං කලු ඇඳන් සමරයි"

**අප්‍රේල් 22**

## උපාධිධාරීන්ට ගෝඨාබයගේ ආණ්ඩුවෙන් ගුටිබැට



ගෝඨාබය රාජපක්‍ෂ මහතා දුන් ඡන්ද පොරොන්දුවක් තමයි සියලු උපාධිධාරීන්ට රැකියා ලබාදෙන බව. නමුත් පසුගිය ආණ්ඩුවලට වගේම මේ ආණ්ඩුවටත් එරෙහිව සටන් කරන්න රැකියා විරහිත උපාධිධාරීන්ට සිදුවෙලා. පසුගිය මාස කිහිපය තුළ විවිධ අරගල කළා. නමුත් ආණ්ඩුව බීරි අලින්ට වීණා වයනවා මෙන් නොඇසුනාක් මෙන් සිටියා. උත්සාහය අත්නොහළ රැකියා විරහිත උපාධිධාරීන්ගේ මධ්‍යස්ථානය විසින් පසුගිය 22 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉදිරිපිට විරෝධතාවයක් දියත් කළා. නමුත් ගෝඨාබය ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ පොලීසිය විසින් එම උපාධිධාරීන්ට පහරදුන්නා. ප්‍රජාතන්ත්‍රවාදය රකිනවා කියලා ආපු ආණ්ඩුව සාධාරණ විරෝධතාවයක්වත් කිරීමට ඉඩසලසා නොදෙන තරමට පත්වෙලා.

**අප්‍රේල් 23**

## අනුරගේ කතාවෙන් චෞර වළල්ල කැළඹෙයි



"ඈත ගම්මානවල දුවා දරුවන්ට හරිහමන් පාසලක් නෑ. ඉස්පිරිතාලේ බෙහෙත් ටික නැතිව ලෙඩ ඇඳේ හූල්ලා හූල්ලා ඉන්න මිනිස්සු!. කෘෂිකර්මාන්තයට නිසි මිලක් නෑ. නොතෙමී ඉන්න නිවසක් නැහැ. වල් අලි කරදරයෙන් තම ජීවිත ගැටගහගන්න බැරුව ඉන්නවා, එහෙම මිනිස්සුන්ට අයිති ධනය හොරකම් කරපු චෞර වළල්ල අද අපේ රටේ ඉන්නවා. ඒ නිසා ඔවුන්ට එරෙහිව සටන් කරන්නැද්ද? අපි මහමඟ මරා දැමුවත් වංචාවට, දූෂණයට එරෙහිව සටන අත්හරින්නේ නැහැ." පසුගිය අප්‍රේල් 23 වැනිදා දේශපාලන පළිගැනීම් කොමිසම් වාර්තාව පිළිබඳ පාර්ලිමේන්තු විවාදයේදී ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා කළ කතාවේ උපුටා ගත් කොටසක් තමයි ඒ. විනාඩි 45කට ආසන්න කාලයක් කළ මෙම කතාව සමාජය මාධ්‍ය තුළ මහත් කතාබහට ලක්වුණා. අපේ රටේ මිනිසුන්ගේ මහජන ධනය දේශපාලකයන්, රාජ්‍ය නිලධාරී, ආරක්‍ෂක අංශ හා මුදලාලිලාගෙන් සැදුම්ලත් සීමිත පිරිසක් විසින් හොරකම් කරන ආකාරය ඔහු විසින් ඉතා දක්‍ෂ ලෙස ඉදිරිපත් කළා. මේ කතාව රටේ බුද්ධිමත් ජනතාව තුළ ඉමහත් කතාබහට ලක්වුණා.

**අප්‍රේල් 24**

## ආතල් ගන්න හිටිය පෝට්සිටියට යන්නත් චීනයෙන් අවසර ගන්න වෙයි

පෝට්සිටිය හැදුනම මරු. ඒකට ගිහිල්ලා කාලා බීලා, ටිකක් විනෝද වෙලා එන්න පුළුවන් කියලා ආඩම්බරයෙන් පොස්ට්වලින්, කමෙන්ට්වලින් බුකිය පුරා ආණ්ඩුවේ ගුණවර්ණනා කළ කෙල්ලෝ කොල්ලන්ට මේ දවස්වල කටඋත්තර නැතිව ඉන්නේ. සර් ගැන මහත් බලාපොරොත්තු තියාගත්තු ජනතාවගේ බලාපොරොත්තු දැන් බොඳවීගෙන යන්නේ. මොකද සර් මැතිවරණයට කියපු දේවල් නෙවෙයි කරන්නෙ. 'රටේ කිසිම දෙයක් විකුණනන් නෑ. විකුණු දේවලුත් ගන්නවා' මහා දේශප්‍රේමී කතා තමයි කිවුවේ. නමුත් අපේ රටේ ඉඩම් ටික, වනාන්තර ටික, කොළඹ වරාය වැනි ජාතික සම්පත් ටික විකුණන්න පටන්ගත්තා. දැන් අලුතෙන් හදපු පෝට්සිටියත් චීනයේ කොලනියක් බවට පත්කරන්න නීති සම්පාදනය කරලා තියෙන්නේ. ලංකාවේ කෙනෙකුට පෝට්සිටි යනවා කියන්නේ වෙනත් රටකට යනව වගේ. මොකද ඒකට චීනයෙන් අවසර ගන්නත් වෙලා. මදැයි අලුතෙන් ඉදිවෙන පෝට්සිටි නගරයට ගිහින් ආතල් ගන්න හිටියා?. ඒ බලාපොරොත්තුවත් ඡන්දය දුන් ජනතාවගේ බොඳවුණු සිහිනයක් බවට පත්වෙලා.


**අප්‍රේල් 24**

## "මම තමයි හොඳටම කළේ ගෑසුත් අඩුයි. මිලත් අඩුයි."




අපේ රටේ ජනාධිපති කරන වැඩ දිහා බැලුවම සිහියට නැගෙන්නේ ඉතිහාසයේ විහිලුකාරයෙකු උන අන්දරේව. මේ දවස්වල බඩු මිල වැඩි නිසා රටේ ජනතාව ජීවත්වන්නේ හරිම අමාරුවෙන්. ජනයාගේ මේ දුක දැනිච්ච අපේ ජනාධිපති ගෝඨාබය රාජපක්ෂ මහතා ගෑස් මිල අඩුකරන්න තීරණය කරලා. එතුමා හරි අපූරු සූත්‍රයක් මේකට යොදවලා තියනවා. රුපියල් 1525ට තිබුණු ගෑස් එක රුපියල් 1426ක් කරලා. ඉතිං ජනතාවත් සතුටු වුණා. හැබැයි 1525ට තිබුණේ කිලෝ ග්‍රෑම් 12.5ට තිබුණු ගෑස් සිලින්ඩරය. එතුමා 1426ට අඩුකරලා තියන ගෑස් සිලින්ඩරය කිලෝ 9.18 වෙනකම් අඩු කරලා. ඇත්තටම අපේ ජනාධිපතිතුමා ජනතාවට පුදුමාකාර ආදරයක් තියෙන්නේ. රුපියල් 122 තිබුණු ගෑස් කිලෝ එක දැන් 155 ගානේ විකුණනවා. කොහොමද ජනාධිපතිගේ ටිකිරි මොළේ?. අවුරුදු 73ක් තිස්සේ අපේ රටේ ජනතාව අන්දලා මේ පාලකයො ඡන්ද ගත්තෙත් ඕන්න ඔහොමම තමයි.

# ධනවාදය පරදා, සමාජවාදය වෙනුවෙන් **ජනබලය ගොඩනගමු!**



මැයි 01 වන දින, මැයි දිනය, එසේත් නැත්නම් ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස හැඳින්වීමට හේතුපාදක වූයේ 1886 චිකාගෝ නුවර කම්කරුවන්ගේ පැය 08ක වැඩ දිනය වෙනුවෙන් කළ දැවැන්ත අරගලයයි.
කෙසේ නමුත් මැයි දිනය යන්න ජනතාවට හුදෙක් පෙළපාලි, රතු කොඩි, රැළි සමඟ සිහියට නැගෙන මතකයක් පමණක්ව තිබේ. නමුත් එවැනි භෞතික දෑවලට කිසිසේත් ලඝුකර නොහැකි මෙය තම අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ කම්කරවන්ගේ රත් ලෙයින් පෙඟුණ දැවැන්ත සිහිගැන්වීමකි.
1886 වකවානුව වන විට එවකට කම්කරවන්ට සිදුවූයේ දිනකට පැය 12 - 16කට අධික කාලයක් තම ශ්‍රමය වැගිරීමටයි. එය හුදෙක් සූරාකන ධනපති පන්තිකයන් ගෙනගිය පීඩාකාරී පිළිවෙතේ ප්‍රතිඵලයකි. මෙම කම්කරුවන් අධික කාලයක් තිස්සේ තම ශ්‍රමය වගුරන්නේ අවම පහසුකම් හිමි දුෂ්කර වටපිටාවක වීමද තවත් විශාල ගැටළුවක් විය. මෙවැනි දුෂ්කරතා රැසක් හමුවේ ඊට එරෙහිව නැගීසිටිම හැර වෙනත් විකල්පයක් මේ කම්කරුවන්නට නොතිබුණි...
පාලක පන්තිය මෙල්ල කළ හැකි ප්‍රබලම අවියක් වන වැඩවර්ජන හරහා ප්‍රහාර එල්ලකර තම අයිතීන් දිනාග ැනීම
කම්කරුවන් මෙහිදී තෝරාගත් මාවතයි. 1886 මැයි 01 වන දින සිට චිකාගෝ නුවරදී වීදි බට කම්කරුවෝ තම ඉල්ලීම් දිනාගන්නා තුරු සටන අත්නොහැරියහ. පාලක පන්තියද මෙම ඉල්ලීම් ලෙහෙසියෙන් ඔවුනට හිමිකරගැනීමට ඉඩකඩ සලසා නොදුන් අතර පොලීසිය යොදාගනිමින් මර්ධනකාරී ක්‍රියාපිළිවෙතක් අනුගමනය කළහ. ඒ අනුව හඳුනානොගත් පුද්ගලයෙකු විසින් එල්ල කළ බෝම්බ ප්‍රහාරයක් පදනම් කරගනිමින් පොලීසිය කම්කරුවන් හට ප්‍රහාරයක් එල්ල කළේය. හෙමකාට් භූමියේදී කම්කරුවන් පිරිසකගේ ජීවිත අහිමි කරමින් එල්ල වූ මෙම ප්‍රහාරයෙන් කම්කරු නායකයන් කිහිපදෙනෙකු පොලිස් අත්අඩංගුවටද පත්වූ අතර ඉන් 7 දෙනෙකු එල්ලා මරා දැමීමටත් අනිත් දෙදෙනා වසර 15ක් සිරගත කිරීමටත් කටයුතු කෙරිණි.
ලෝකවාසී කම්කරුවන්ට පැය 8 වැඩමුරය දිනාදුන් මෙම අරගලය පාදක කරගනිමින් දෙවන සමාජවාදී ජාත්‍යන්තරයේ පැරීසියේ පැවැති පළමුවැනි සමුළුවේ දී මැයි 01 වන දින ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස නම් කරන ලදී...

මෙලෙස නිර්මාණය වූ ජාත්‍යන්තර කම්කරු දිනය කම්කරු පන්තියේ අයිතීන් දිනාගැනීම සඳහාත්, ඔවුනට සිදුවන අසාධාරණයන්ට එරෙහිව නැගීසිටීමට ජවයක් සපයන සහ එදා කම්කරු අයිතින් වෙනුවෙන් දිවි පිදූ කම්කරුවන් සිහිගැන්වීමේ දිනයකි. නමුත් දැන් දැන් එදා චිකාගෙ ් කම්කරුවන් පගා දැමූ ධනපති පන්තියේ පාලකයන් හා දේශපාලන පක්ෂ ඔවුන්ගේ පටු අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා මැයි දිනය පාවිච්චි කරයි. මැයි දිනයේ නියම අර්ථය වසන් කර එය සැණකෙළියක් බවට ලඝුකොට දක්වන එම කූට ධනපති අරමුණු ඉදිරියේ මැයි දින සැබෑ අරුත පැහැදිලි කරදීම හා පැහැදිලි කරගැනීම අපගේ වගකීමකි.
එදා චිකාගෝ කම්කරුවන් මෙන්ම අදත් අසාධාරණකම් රැසකට මුහුණදීමට කම්කරු ජනයාට සිදුවීම කණගාටුවට කරුණකි. සනීපාරක්ෂක පහසුකම්, ආහාර, ජලය යන මූලික අවශ්‍යතාවත් නිසි ලෙස නොලබමින් වැඩකරන කම්කරුවෝ අවසානයේ ප්‍රමාණවත් වැටුපක්ද නොලබති. අවම පහසුකම් යටතේ වැඩකිරීම නිසාම විශාල වශයෙන් සෞඛ්‍ය ගැටළු රැසකට ගොදුරුවන වැඩකරන ජනතාව ඊට ප්‍රතිකාර ලබාගැනීමේදී නැවතත් දුෂ්කරතාවයට පත්වේ.
එදා මෙන් අදත් වැඩකරන ජනතාව පීඩාවට පත්කරමින්, ඔවුන්ගේ ශ්‍රමය සූරාකමින්, තම ධනය, බලය තර කර ගැනීමට කටයුතු කරන ධනපති පාලකයෝ එම අසාධාරණකම්, අකටයුතුකම් විවේචනය කරන පිරිස මර්ධනය කරන්නටත් පසුබට නොවෙති. එපමණක් නොව නීතියද ධනපති පාලකයන්ට අවැසි ලෙස සකසා ඒ තුළින්ද කිසිදු හර්හරණක් ලබාගැනීමට අවස්ථාවක් නොමැති තැනට ඇද දමා තිබේ. එසේ නම් එදා චිකාගෝ කම්කරුවන්ට සේම සියලු අසාධාරණයන්ට එරෙහිව හඬනැගීම හා නැගී සිටීම විනා අන් සරණක් නොමැත.
වර්තමාන ශ්‍රී ලංකාව අතිදැවැත්ත ණය උගුලකට ඇද දමා තිබේ. ඒත් සමඟ කොරෝනා වෛරසය හමුවේ දැවැන්ත සටනක් කළ යුතු මොහොතක්ද උදාවී තිබේ. මේ අතර වැඩකරන ජනතාවට හිමි කිසිදු අයිතිවාසිකමක් නිසි ආකාරව ඉටුනොකර, ඒ වෙනුවෙන් හඬ නගන්නවුන්ද මර්ධනය කරමින්, ඉතා අසමත් ලෙස ආණ්ඩුව කටයුතු කරමින් සිටී. ආර්ථික වශයෙන් දැවැන්ත කඩාවැටීමකට ලක්ව ඇති මොහොතක පවා තම බලය, ධනය තර කරගන්නේ කෙසේද යන්න ගැන පමණක් සිතන ආණ්ඩුවක් රට ගෙනයන මොහොතක, ධනවාදයේ සැබෑ අසමත්කම අප ඉදිරියේ සක් සුදක් සේ පැහැදිලිව පෙනෙයි.
මෙවැනි අසමත් ධනවාදී පාලනයකින් තවදුරටත් වැඩකරන ජනතාවට කිසිදු අයිතිවාසිකමක් හෝ යහපත් ජීවිතයක් හෝ ලැබේ යැයි කිසිදුවිටක සිතිය නොහැකිය. ඒසේනම් මේ සමාජ ක්‍රමය වෙනස්කිරීමේ සටන වැඩකරන කම්කරු ජනතාව ලෙස ගෙන යා යුතුම මොහොත මෙයයි.
එබැවින් මෙවර මැයි දින සැමරුම හුදෙක් චිකාගෝ කම්කරවන් සිහිගැන්වීමට පමණක් නොව, අසමත් ධනවාදය පැරදවීමේ සහ නව සමාජවාදී සමාජ ක්‍රමයක් දක්වා සමාජය පැදවීමේ හබල හැසිරවිය හැකි කණ්ඩායම ලෙස රටේ වැඩකරන ජනතාව ඒකරාශී විය යුතු වැදගත් අවස්ථාවක් කරගනිමු!. සාධාරණ හා යුක්තිගරුක සමාජයක් වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් වැඩකරන කිසිවෙකුට පරාජය කළ නොහැකි, අතපෙවිය නොහැකි බල පවුරක් ගොඩනගමු!. ඒ සඳහා ශ්‍රී ලාංකීය වැඩකරන ජනතාවට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා! සකල ලෝකවාසී කම්කරු ජනතාවට ජය වේවා!!..

# චීනයට සින්න වීම

චීන ආරක්ෂක ඇමතිවරයා හදිසියේම ලංකාවට ගොඩබැස්සේය. මෙය හදිසි ගොඩබැසීමක් නොවන්නේය. මන්ද යත් චීන ආර්ථික උපායමාර්ගය දිගුකාලීන එකක් වන නිසාය. චීන ආර්ථික උපායමාර්ගයේ ප්‍රධාන මරමස්ථානයක් වන ලංකාව ඔවුන්ගේ ආර්ථික උපායමාර්ග වෙනුවෙන් පරිහරණය කිරීම සිදුකරමින් පවතී. එනයින් පෝට්සිටි ව්‍යාපෘතිය, චීනයේ ප්‍රධාන ආර්ථික උවමනාවක් වෙනුවෙන් ගොඩනැගුණු එක් ව්‍යාපෘතියකි.
මේ වනවිට පෝට්සිටි නම් මෙම වරාය නගර ව්‍යාපෘතියේ වරාය ගොඩකිරීමේ ක්‍රියාවලිය අවසන් කොට ආයෝජකයින් ගෙන්වාගැනීම ආරම්භ කර ඇත. මේ පිළිබඳව රට තුළ දැවැන්ත සමාජ විරෝධයක් නිර්මාණය වී ඇත. ඒ වෙන කිසිවක් නිසා නොව මෙහි ඉදිකිරීමට යන වරාය නගරය ලංකාවේ නීතියට යටත් නොවන, ව්‍යවස්ථා විරෝධී, වෙනම රාජ්‍යයක හැඩරුව ගැනීම නිසාය.
මේ වෙනුවෙන් පසුගියදා පනත් කෙටුම්පතක් නීතිගත කළේය. එහි සඳහන් කරුණු අනුව,




**01.** **මෙම අක්කර 1115ක භූමිය ලංකාවේ කිසිදු පරිපාලන බල ප්‍රදේශයකට හෝ කිසිදු පරිපාලන ආයතනයකට අයත් නොවේ.**

**02.** **මෙම භූමියේ පරිපාලනය සිදුවන්නේ පස්දෙනෙකුට නොඅඩු, හත්දෙනෙකුට නොවැඩි නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කොමිෂන් සභාවක් මඟිනි. එමඟින් පත්කෙරෙන සභාපතිවරයෙක් හා කොමසාරිස්වරයෙක් මෙහි පරිපාලනයේ ප්‍රධාන නිලධාරීන් වන්නේය. මෙම කොමිසමට නියෝජිතයින් පත්කිරීමට බලය ඇත්තේ ජනාධිපතිවරයාගේ තනි කැමැත්ත මතය. එමෙන්ම එම නියෝජිතයින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ම විය යුතු නොවේ. එමෙන්ම මෙම කොමිසමට ලංකාවේ ජනාධිපතිවරයාට පමණක් හිමි මුක්තියද ඇත.**

**03.** **වෙනම කලාපයක් ලෙස පවතින අක්කර 1115ක මෙම භූමිය තුළ නීතිය ක්‍රියාත්මක කරන වෙනම අන්තර්ජාතික බේරුම්කරන මධ්‍යස්ථානයක් පිහිටුවනු ඇත. මෙය කෙසේවත් ලංකාවේ අධිකරණ පද්ධතියට සම්බන්ධ නොවන අධිකරණයක් ලෙස ක්‍රියාත්මක විය හැක.**

**04.** **මෙම භූමියෙන් භාණ්ඩයක් මිලදීගෙන පිටතට පැමිණෙන්නේනම් විශේෂ බද්දක් ගෙවීමට සිදුවන අතර එම බද්දේ ප්‍රමාණය තීරණය කරන්නේ ඉහත කී කොමිෂන් සභාව මඟිනි.**

**05.** **මෙම වරාය නගරයේ මුදල් ගණුදෙනු විදෙස් මුදල්වලින් සිදුවන අතර පඩි ගෙවීම් පවා සිදුවන්නේ විදෙස් මුදල්වලිනි.**

**06.** **එමෙන්ම මෙම භූමියට අදාල ජලය, විදුලිය, මාර්ග, ප්‍රවාහන, කසල ප්‍රතිචක්‍රීකරණය වැනි යටිතල පහසුකම් ලංකාවෙන් සැපයිය යුතුය.**

**06.** **මෙම භූමිය ලංකාවේ ජනතා නියෝජිතයින් පත්කරගන්නා කිසිදු මැතිවරණයකට සම්බන්ධ නොවන අතරම ජනතා පරමාධිපත්‍යය හිමි කිසිදු ආයතනයකට වගකියනු නොලැබේ. මේ නිසාම මෙහි මුදල් ගණුදෙනු විගණනය කිරීමට ලංකාවේ කිසිදු ආයතනයකට අවසර නොමැත.**

**07.** **යම් ආයෝජකයෙකු හට ලංකාවේ පවතින පාරසරික හෝ වෙනත් නීතිවලට පටහැනි ව්‍යාපාතියක් සඳහා අවසර නොලැබෙන තත්වයක් යටතේ ඉහත කී කොමිසම ඒවා නොසලකාහරිමින් මෙම ආයෝජකයාට ඉඩ ලබාදිය යුතුයැයි තීරණය කළහොත් අනිවාර්යයෙන්ම එය ලබාදීමට ලංකා රජය බැඳී සිටී.**
**මෙලෙස අපගේ මාතෘභූමියට අයිති අක්කර 1115ක භූමියක් රටේ මූලික නීතියටද යටත් නොවන වෙනම රාජ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීමේ දැඩි අනතුරකට ලක්ව තිබේ. මෙලෙස ගත් කල,**

**01.** **මෙය මුක්තිය හිමි දෙස් හෝ විදෙස් පාලකයින් හත්දෙනෙකුට සීමා වූ ලාංකිකයන් වන අපද බදු ගෙවිය යුතු වෙනම පරිපාලන ප්‍රදේශයකි.**

**02.** **වෙනම අධිකරණ බලතල සහිත පරිපාලන ප්‍රදේශයකි.**

**03.** **වෙනම මුදල් පාලන බලතල සහිත පරිපාලන ප්‍රදේශයකි.**

**04.** **වෙනස්ම නීති සහිතව විදෙස් රාජ්‍යයන් හෝ සමාගම් සමඟ ගණුදෙනු කළ හැකි වෙනම පරිපාලන ප්‍රදේශයකි.**

මෙම වරාය නගර පනත් කෙටුම්පත මඟින් රටත් අනාගත පරම්පරාවත් විශාල අනතුරකට හෙලා ඇති අතර වෙනම රාජ්‍යයක් නිර්මාණය වීමේ ඉඩකඩ සලසා ලංකාවේ ස්වාධිපත්‍යටද හානි කරමින්, අධිරාජ්‍යවාදී බලගැටුමේ කේන්ද්‍රස්ථානයක් බවට ලංකා භූමිය පත්කරමින් ඇත. මන්ද යත් මෙමඟින් ලෝක ආර්ථික යුද්ධයේ ඇමරිකාව ප්‍රමුඛ බටහිර කඳවුර හා චීනය අතර ඉන්දියන් සාගර කලාපය අත්පත් කරගැනීමෙහිලා වන සටනේ අනිවාර්යනීය කොටස්කරුවෙක් බවට අප රට පත්වීම වළක්වාගත නොහැකි නිසාවෙනි.
එමෙන්න මෙමඟින් ලංකාවට අතිදැවැන්ත ආර්ථික අනතුරකට මුහුණදීමටද සිදුවේ. මන්ද යත් මෙම භූමිය මුදල් විශුද්ධිකරණයේ තෝතැන්නක් වනවා මෙන්ම මෙම භූමියේ සිටින ආයෝජකයින්ට දේශීය ආයෝජකයින් සමඟ හවුල්කාර ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රතිපාදන සපයා ඇති නිසා විදේශීය මහා පරිමාණ සමාගම් විසින් දේශීය සමාගම් ගිලගැනීමේ අනතුරකටද මුහුණදිය හැකි නිසාය. තවද මෙහි යටිතල පහසුකම් ලබාදෙන ආයතන රටේ මහජනතාවගේ බදු මුදලින් නඩත්තු වන ආයතන වන්නේය. නමුත් එහි කිසිදු ප්‍රතිලාභයක් බදු ගෙවන ජනතාව සතු නොවේ.
රාජපක්ෂවරු විසින් තම කණ්ඩායමේ පාර්ශවවලටද නොකියා, කොළඹ වරාය නගර කොමිෂන් පනත  අධීක්ෂණය කිරීම සඳහා පත්කළ අමාත්‍ය අනුකම්ටුවේ අධ්‍යයනයකින්ද තොරව, නිවාඩු දින පහක් සහිත සති අන්තයක මෙය පාර්ලිමේන්තුවට ගෙන ආවේ විරෝධතාවලටද ඉඩක් නොතබමින්ය.
මෙලෙස රාජපක්ෂවරුන් රටම දැවැන්ත අනතුරක හෙලමින් චීනය වෙනුවෙන් තම න්‍යාය පත්‍ර සකසන්නේ පුද්ගලිකව තමන්ට ලැබෙන ලාභ ප්‍රයෝජන ගැන සිතමින්ය.
එබැවින් මෙම සිදුවීමට නියමිත අනතුර අවදානයට ගෙන, දේශීය රූකඩ පාලකයන්ගෙන් මෙන්ම විදෙස් බලවේගවලින්ද මෙරට මුදාගැනීම ශ්‍රී ලාංකික අප කාගේත් වගකීම වන්නේය.



# The දත්ත Great අපේ Hack අයිතියයි

"මං දැනගෙන හිටියා ඔන්ලයින් ක්‍රියාකාරකම් වලින් අපෙ දත්ත ලීක්වෙන එක විතරක් නෙවෙයි, විෂයෙහි ගැඹුරට යනකොට මට තේරුණා මේ ඩිජිටල් සලකුණු මගින් කර්මාන්තයක් ලෙස ඩොලර් ට්‍රිලියන ගණන් උපයන බව. අපි තමා දැන් එකේ වෙළඳ භාණ්ඩය!"

ඔබේ පෞද්ගලිකත්වය කෙතරම් සුරක්ෂිතද?...ඔබ හා නිතර දෙවේලෙ ගැවසෙන ස්මාර්ට් ජංගම දුරකතනයට ඔබ යෙදූ මුරපදයෙන් ඔබව කෙතරම් දුරට ආරක්ෂා වී ඇත්ද?..ෆේස්බුක් ඇතුළු සෑම ඩිජිටල් සබඳතාවක් භාවිතයේදීම ඔබ කීවරක් ඒවායේ නියමයන් හා කොන්දේසි සළකා බැලුවාද?. මේ ඔබ සහ ඔබේ දත්ත සුරක්ෂිතභාවය පිළිබඳව කොන්දේසි විරහිතව සිතා බැලිය යුතු කාලයයි.!..

"මේ වගේ දැන්වීමක් දැකල තියෙන්නෙ කව්ද?...ඔයාට ඒත්තු ගන්වන, ඔයාගෙ මයික්‍රපෝනය ඔයාගෙ සංවාදවලට සවන්දෙන බව?..."

ශාලාවේ සිටි සිසුන්ගෙන් වැඩි හරියකගේ දෑත් ඉහළට එසැවිණි. එය ඇසූ ඩිජිටල් මාධ්‍ය ගුරුවරයා උස් හඬින් සිනාසැළුවේය..

මේ 2019 දී තිරගත වුණු The great hack වාර්තාමය චිත්‍රපටයයි..2016 ඇමරිකානු ජනාධිපතිවරණයේදී සිදුවන දත්ත වංචාවක් නිරාවරණය වීම අළලා මූලිකව ගොඩනැගුණු මෙම නිර්මාණය හොලිවුඩය විනිවිද යමින් ලෝකයේම දෑස් නිලංකාර කරවන සුළු සත්‍යක් පොළොවට සමපාත කරන විශිෂ්ට කලා කෘතියකි.. 2020 BAFTA awardsහි හොඳම වාර්තාමය චිත්‍රපටයට නාමයෝජිත මෙහි අධ්‍යක්ෂණය Karim Amer හා Jehane Noujaim විසින් වන අතර නිෂ්පාදනය Karim Amer, Jehane Noujaim, Pedro Kos ඇතුළු කණ්ඩායම විසිනි.

"මම බොහෝ කාලයක් කල්පනා කළා. අපේ දත්ත සහ තොරතුරු අනිසි විදියට භාවිත කරන එක ගැන...2016 මැතිවරණයෙන් මට තේරුණා එය සිදුවෙමින් පවතින බව......"

2016 වසරේ ඇමරිකානු ජනාධිපතිවරණයට තරඟ වැදි ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ඩිජිටල් මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපෘතිය ප්‍රොජෙක්ට් ඇලමෝය.. ඇමෙරිකානුවන් වෙත බලපෑම් කරනු වස් ඔවුන් සමාජ මාධ්‍යයන් කෙතරම් භාවිත කළාද යත්, ප්‍රොජෙක්ට් ඇලමෝහි උච්චතම අවස්ථාවේ ඔවුන් ෆේස්බුක් දැන්වීම් සඳහා පමණක් දිනකට වැයකළ මුදල ඩොලර් මිලියනයකි.

"..කේම්බ්‍රිජ් ඇනලිටිකා ප්‍රොජෙක්ට් ඇලමෝහි වැඩකළ එක් සමාගමක්. ඒක යම් විදියක මොළයක්. දත්ත මධ්‍යස්ථානයක්. අපි මේ රාජ්‍ය ඉලක්ක කරගන්න ඕන, අපි ඒ රාජ්‍ය කියල අදහස ගන්නෙ අපි එතනින්.. ඔවුන් සතුව සෑම ඇමරිකානුවෙකු පිළිබඳවම දත්ත 5000ක් පමණ තියෙනවා..."

The great hackහි කතානායකයා, එනම් ඩිජිටල් මාධ්‍යය පිළිබඳ ගුරුවරයෙකු වන ඩේවිඩ් කැරොල් හඬගන්නේ එලෙස ඇමෙරිකානුවන්ගේ දත්ත අවභාවිත කළ කේම්බ්‍රිජ් ඇනලිටිකාට එදිරිවයි. තමාට මෙන්ම අනාගතයේදී තම දරුවන්ටද ව්‍යසනයක් විය හැකි මේ අදෘශ්‍යමාන වංචාවට එරෙහිව ඔහු අධිකරණය වෙත යන්නේය.. Carole Cadwalladr නම් අතිදක්ෂ මාධ්‍යවේදිනිය සමඟ එක්වී ඔහු අවධාරණය කරන්නේ ලොව සෑම මිනිසෙකුගේම දත්ත නම් වූ මූලික අයිතිවාසිකම සුරක්ෂිත වියයුතු බවයි!...

"ස්ටීව් බැනන් කේම්බ්‍රිජ් ඇනලිටිකාහි ප්‍රධාන අයෝජකයෙක්. එයාට එයාගෙ සංස්කෘතික යුද්ධයට එරෙහිව සටන්කරන්න ඕන උනා. අපිට එයා වෙනුවෙන් සැලසුම් හදන්න දත්ත ලබාගන්න සිස්ටම් එකක් ඕන උනා. එවිට කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කෝගන් අපට විශේෂ අවසරයක් තියෙන ටූල්ස් වගයක් දුන්නා. ෆේස්බුක් ඇප් එකට ජොයින් උන සේරම අයගේ දත්ත ඒ ටූල් එකෙන් ගන්න පුලුවන් ඔවුන්ට නොදැනීම..."

පුරා පැය දෙකයි මිනිත්තු 19ක් පුරා The great hack අපට ගෙන එන්නේ දත්ත වංචාවක කතාවක් පමණක් නොවේ!..මිනිසාගේත් පොදු සමාජයේත් යහපැවැත්ම වෙනුවෙන් යොදාගත යුතු දැනුම, බුද්ධිය, විද්‍යාව හා තාක්ෂණය මිනිසාගේම අභාවය දෙසට හසුරුවන මේ කුරිරු ධනවාදය තුළ මිනිසා සහ ඔහුගේ සියලු සිතුවිලි, ප්‍රාග්ධනයේ අතකොළු වන ආකාරයත්, ධනවාදී සමාජය තුළ මුලු මැතිවරණ ක්‍රමයම දේශපාලන රඟපෑමක් හා ප්‍රෝඩාවක්ම වන බවත් ය.

එසේ නම් රටක පුරවැසියන්ගේ දත්ත සුරක්ෂිතභාවය පිළිබඳව ලෝකවාසී සියල්ලගේ දෙනෙත් අවදිකළ ඩේවිඩ් කැරොල්ගේ අරගලය කෙසේ වේවිද?..එයට රුකුල්දෙන්නේ කවුරුන්ද?..ඔහු කෙසේ එම සටන ජයගනීවිද?..වරදකරුවන් කවුරුන්ද?...ඔබ සමාජ මාධ්‍යයන් ගැන දන්නේ මොනවාද? ඔබේ සුරතලාගේ මතයකයන් පවා ඔබට ගෙන එන ඔබේ මිතුරා සකර්බර්ග් තවදුරටත් ඔබට මිතුරෙක් වේවිද?..ලෝකයේ බලවතාගේ බලවතුන් වන ඩෝනල්ඩ් ට්‍රම්ප්, ඔබාමා වැන්නන් තවදුරටත් ඔබගේ වීරයින්ගේ ලැයිස්තුවේ හිඳීවිද?..එන්න. නරඹන්න. කියවන්න..ධනවාදය නම් කිළිටි මඩගොහොරුවේ නිරුවත සිත්පිත් නැතිව තිරයේ දිග හරින the great hack සත්‍ය කතාව හැබැහින් විඳගන්න...

## සරදියෙල්ගේ කොලම

"බලන්න, කාටවත් රුපියල අධි ප්‍රමාණය වෙනවා පේන්නෑ. අද 192යි නේ. දැක්කනේ අපේ වැඩ." කබ්බෙක් ෆෝම් වෙලා. ඇත්තටම ෆෝම් වෙලා නෙවෙයි, 69 ලස්සේ එකතු වෙලා ෆෝම් කළානේ. සරදියල් කබ්බගේ ටෝක් එක අහලා අනිත් පැත්ත හැරුණා විතරයි, මෙන්න රුපියල ආපහු 205 වෙලා. කබ්බගේ රෙදි ගලවනවා දියවන්නාවේ හර්ස ඩී. ලැජ්ජාවේ බෑ. වැඩේ කියන්නේ මුංට ලැජ්ජාව කියලා එකක් නෑනේ.

එහෙම ලැජ්ජාවක් තියේ නම් A.K.D.ගේ දියවන්නාව දෙදරන්න කරපු කතාවෙන් පස්සේ ගොඩක් එවුන්ට රෙදි ඇඳගෙන ඔතන ඉන්න පුළුවන්කමක් නෑනේ.

ඉස්සර යුද්ධෙ විකුණන් කෑවා වගේ දැන් මුංට හම්බෙලා තියෙනවා තලු මර මරා රස කරන්න කොරෝනාව. හොර රහසේ පනත් සම්මත කරන්න ඕනි උනාම කොරෝනා උණුසුම වැඩිවෙනවා. කාට හරි කෝල් එකක් ගන්නකොට කොරෝනා සිංදුව දාලා අපිව බය කරනවා. ඉස්කෝලේ සතියකට දෙකකට වහනවා. තමන්ගේ පුද්ගලික වාහනේ යන්න පුළුවන් ගාණ දෙකකට බස්සනවා. බස්වල හතලිහ පනහ අඳුනන්නේ නැති උන් ලෝඩ් කරලා යනවා. සති අන්තේ පරිස්සමින් ගෙදර ඉන්න කියලා සඳුදට කෝච්චියේ තෙරපි තෙරපී වැඩට යනවා.

චීනා අත දිගෑරලා ණය දෙනවා. වෙන රටවල්වලින් ගත්ත ණය වාරික ගෙවන්නත් චීනා සල්ලි දෙනවා. අන්තිමට චීනට තමයි අපි වැඩිපුරම ණය. ඉතිං ඌ කියන කියන එක කරන්න වෙනවා. හම්බන්තොට දුන්නා. කොළඹ අක්කර ගාණක පෝට් සිටිය උන්ට තියෙනවා. ලංකාවේ නීතිවලින් උන්ට ඒ භූමිය නිදහස් කරලම දෙන්නයි යන්නේ. විකිරණශීලී යුරේනියම් ටොන් ගාණක නැව් හොර රහසේම හම්බන්තොට ගාල් කරනවා. මෙච්චා නවත්තන්න කියලා 69 ලස්සේ ගෙනාපු සිංහයාව හීලෑ කරලා චීනා උගේ සර්කස් එකට අරන් තියෙන්නේ. ඌ චීනා කියන කියන දේ කරනවා. චීනා ඌට නැට්ට වනනවා. 69 ලස්සෙට දැන් හොඳටෝම සනීප ඇති!.

නූතන පරපුරේ

සරදියල්



# ලාංකිකයන් සංවර්ධනයේ අනාථයන් කරන වරාය නගරය

වරාය නගරය යැයි පැවසූ විට අපට දකින්නට ලැබෙන්නේ කොළඹ වරාය සහ ගාලුමුවදොර අතර මුහුදු සීමාවේ වැලි කඳු ගොඩගසා ඉදිකරමින් පවතින දූපතකි. ඒ පිළිබඳව ආණ්ඩු හිතවාදී නොයෙකුත් උගතුන් යැයි කියාගන්නා පිරිස් විසින් ව්‍යාපෘතිය පිළිබඳව කරන නෙක වර්ණනාවන්ට අනුව මෙය හෙක්ටයාර 266කින් සමන්විත රටට තවත් භූමියක් එක්කරන අවස්ථාවකි. ඒ වගේම මෙය ඉදිකිරීමත් සමගම මෙහි ඇතිවන ව්‍යාපාර සමඟ රට සංවර්ධනය වන බවත්, සෞභාග්‍යමත් දේශයක් බවට රට පත්වෙන බවටත් රටවැසියන් නොමඟ යැවීම සඳහා පාරම්බාන පාරම් බෑම් එමටය. එයින් සිදුවනුයේ රට තුළ ජීවත් වන ජනතාව සංවර්ධනයේ අනාථයන් බවට පත්කිරීමකි.

වරාය නගර ව්‍යාපෘතිය යනු ලංකාවේ පවතින නීතිරීති හා අණපනත් උල්ලංඝණය කරමින් සාගරය වෙරලබඩ කලාපය සහ රට අභයන්තර ස්වභාවික සම්පත් විනාශ කරමින් ධීවර ජනතාව සහ රටේ ජීවත්වන මුළුමහත් ජනතාවම පීඩනයට ලක්කරමින් ඉදිවෙමින් පවතින ව්‍යාපෘතියකි. මෙවැනි ආකාරයේ මුහුද ගොඩකර ඉදිකර ඇති ලෝක ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකිරීමේදී ලංකාවේ ඉදිවන මෙම වරාය නගර ව්‍යාපෘතිය විශේෂ වෙනස්කමක් ගනී. අනෙකුත් රටවලට වඩා ලංකාවේ සාගරය වෙනස් වන අතර මත්ස්‍ය සම්පත අතින් පෝසත්ය. එසේම උදම් රළ සහිත සාගර කලාපකි. ලොව මෙවැනි ඉදිකිරීම් කළ අනෙකුත් ස්ථානවල උදම් රළ බලපෑම සහ සාගර මත්ස්‍ය සම්පත නොමැතිවීම විශේෂත්වයකි. එහෙත් අප රටේ සිදුවෙන මෙම ව්‍යාපෘතිය නිසි පරිසර අධ්‍යයනයකින් තොරව ඉදිකරමින් පවතී.

වරාය නගර ව්‍යාපෘතිය වෙනුවෙන් පෙනී සිටින්නන් බොහෝවිට පවසන දෙයක් වනුයේ මෙම ව්‍යාපෘතිය මගින් රටේ සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි බවය. ඔවුන් පවසන ආකාරයෙන් ව්‍යාපෘතිය දැනටමත් රට තුළ කිරීම සඳහා ආයෝජන කලාප ඇත. බොහෝවිට ලංකාවේ ආයෝජන කලාපයේ ප්‍රයෝජනයක් නොගන්නා භූමි දක්නට ලැබෙන අතර එවැනි ස්ථානයක මෙවැනි ව්‍යාපාර ස්ථාපිත කිරීම සඳහා බාධාවක් නොමැත.

එහෙත් වරාය නගර ව්‍යාපෘතිය වෙනුවෙන් පෙනීසිටින්නන් පාරම්බාන සංවර්ධනයේ ඉලක්ක සපුරාගැනීමට වරාය නගර අනවශ්‍යය. රටේ ඇති ආර්ථික අබිබගාතය සුවකිරීම සඳහා වරාය නගර වැනි ව්‍යාපෘතිවලට කළහැක්කක් නොමැත. කඩා වැටුණු ධනේශ්වරය කෙලින් කිරීම සඳහා ධනවාදය නොයෙකුත් උපක්‍රම භාවිතා කරයි. බදු වංචා කිරීම්, කළු සල්ලි සුදු කිරීම හා සේවක අයිතිවාසිකම් ගණන් නොගෙන ව්‍යාපාර කරගැනීම මෙන්ම පෝට් සිටි වැනි ව්‍යාපෘති හරහාද තම ලාභ පංගුව වැඩිකර ගැනීමට ධනපතියාට හැකිවේ. ඔවුන්ගේ අරමුණු වනුයේ ශ්‍රමයට නොගෙවන ප්‍රමාණය තුළින් අතිරික්ත ධනය වැඩිකර ගැනීමය. 1978 දී ඇතිවූ විවෘත ආර්ථික හඳුන්වාදීමේදීද අපට අසන්නට ලැබුණේ මෙවැනි සුරංගනා කතාය. එහෙත් 1978 පෙර පැවති ලෝක ආර්ථිකයේ ලංකාවේ පංගුව අද වන විට අපෙන් අහිමි වී ගොස්ය. දවසින් දවස ලෝක ආර්ථිකයේ ලාංකීය පංගුව ක්ෂය වෙමින් පවතී.

වරාය නගර ව්‍යාපෘතියේ ආයෝජන වටිනාකම ඩොලර් බිලියන 1.4කි. තවමත් වැඩ අවසන් නැති මෙම ව්‍යාපෘතියේ අසාර්ථකභාවය නිසා ලාංකේය ජනතාවගේ මුදල් රුපියල් මිලියන තුන්දහසක් පමණ දැනටමත් නිකරුණේ වැයවී ඇත. වැලි ලබාගැනීම නිසා මත්ස්‍ය සම්පත නෙලාගත නොහැකි ධීවරයන්ට වන්දි වෙනුවෙන් පමණක් මිලියන 500ක්ද, ගල්කිස්ස දෙහිවල ප්‍රදේශයෙන් වෙරළ හිම්වීම නිසා එම වෙරළට වැලි පිරවීම වෙනුවෙන් මිලියන 890ක්ද, වත්තල කොච්චිකඩේ මුහුණ තීරයේ අසාර්ථක ගල් ඇතිරීම සඳහා මිලියන 1700කට ආසන්න ප්‍රමාණයකුත් ජනතා මුදල් වියදම් කොට ඇතත් ඒවා අසාර්ථක ව්‍යාපෘති විය.

වරාය නගර ව්‍යාපෘතිය නිසා රටට වන විශාලතම හානිය පරිසර හානියය. මුහුදින් හෙක්ටයාර 266ක භූමියක් ඇතිකර ගැනීම සඳහා වන මෙම ව්‍යාපෘතිය 2012 සිට මේ දක්වා පැවැති ආණ්ඩු තුන විසින්ම ව්‍යාපෘති භූමි ප්‍රමාණය සහ ව්‍යාපෘතියේ චීනයට අයත් පංගුව වැඩි කරමින් සිටීම දක්නට ලැබෙන්නකි. නූතන ආණ්ඩුව මෙම ව්‍යාපෘතිය හෙක්ටයාර 446.6ක් දක්වා වැඩි කිරීම සඳහා පිඹුරුපත් සකසමින් පවතී.

මෙම භූමිය ඉදිකිරීම සඳහා රට තුළ ඇති සහ සාගරයේ ඇති ස්වාභාවික සම්පත් විශාල ප්‍රමාණයක් භාවිතා කිරීමට සිදුවිය. කළුගල් සහ මුහුදුවැලි මින් ප්‍රධානය. භූමිය ගොඩකිරීම සඳහා පමණක් කළුගල් ඝන කියුබ් මිලියන 16ක් පමණද මුහුදුවැලි ඝන කියුබ් මිලියන 65ක්ද අවශ්‍ය වන අතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කළුගල් ඝන කියුබ් මිලියන 7ක් පමණක් අවශ්‍ය වේ. මෙම ව්‍යාපෘතිය තවත් පුළුල් කරන්නේ නම් අවශ්‍ය වන කළුගල් සහ වැලි ප්‍රමාණය එම ප්‍රමාණයට සාපේක්ෂව ඉහළ යනු ඇත. කළුගල් සහ වැලි ලබාගැනීමෙන් සිදුවන පරිසර හානිය අතිමහත්ය. සමහර පරිසර පද්ධතීන් පවා එම කළුගල් සහ වැලි ඉවත්කිරීම මගින් පෘථිවියට අහිමි වී ගොස්ය. මුහුදුවැලි ලබාගැනීම නිසා රටේ ඇති සමහර මත්ස්‍ය සහ සාගර ජීවී විශේෂ අතුරුදහන් වී ඇති අතර සාගර ජල රටාවේ වෙනස්වීමක්ද සිදුවී ඇත.

මෙම ඉදිකරන ප්‍රදේශය 1505 සිට වරාය භූමියක් වන අතර එහි ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමද පිළිබඳ කිසිදු සොයාබැලීමකින් තොරව විනාශ කර ඇත. මෙම භූමිය කොරල්පර, වැලිපර, ගල්පර හා ගිලිණු නැව්වලින් සමන්විත විශේෂ පරිසර පද්ධතිවලින් ගහණ ජීව විශේෂ බොහෝමයකට රැකවරණය සලසන කලාපයකි. මෙම ප්‍රදේශයේ මුහුදු තීරයේ ක්ෂීරපායී විශේෂ පමණක් 15ක් පමණ වාසය කර ඇත. පානදුර සිට මීගමුව, කොච්චිකඩේ දක්වා වෙරළ තීරය විනාශ වී ඇති අතර එම ප්‍රදේශයේ ධීවර පවුල් 15,000කින් 9000ක් පමණ ඍජු බලපෑමට ලක් වී ඇති අතර ඉතාමත් ස්වභාවික පාරිසරික පද්ධතියක් වන මීගමු කලපුවද මෙහි බලපෑමට ලක් වී ඇත. මෙම ඉදිකිරීම සඳහා අවශ්‍ය වූ සක්‍යතා අධ්‍යයන වාර්තාව, ව්‍යාජ ලෙස සකස් කර රටත් ජනතාවත් නොමඟ යවා ඉදිකරනු ලැබූවක් වන අතර එයට අවශ්‍ය ජෛව විවිධත්ව අධ්‍යයනය පවා සිදුකර නොමැත.

කුමන තත්වයක් මත වුව මෙම භූමිය දැන් ගොඩකර හමාරය. පරිසර විනාශය මධ්‍යයේ වුවද ගොඩනැගූ මෙම භූමිය ලාංකීය නීතියට සහ ලාංකීය පරිපාලනයට අවනත ප්‍රදේශයක් බවට පත්කර ගැනීම සඳහා අවශ්‍යවන සාධක මතු වී ඇති අතර මෙරට තුළ තවත් රටක භූමියක් නිර්මාණය කිරීම පරාජය කළ යුතුය. ඒ වගේම ලෝක සුදු අන්තුන්ගෙ සුදු පිටියක්, මුදල් ජාවාරම්කරුවන්ගේ ආයෝජන භූමියක් සහ නොයෙකුත් විෂමාචාර කටයුතු සිදුවෙන තැනක් බවට පත්වීම වැළැක්විය යුතුය.

The Gadget

# Wearable air conditioners



රියාන් පොකට් යනු තරමක් සිහින් පාම් ප්‍රමාණයේ සුදු ප්ලාස්ටික් උපාංගයක් වන අතර එය ඔබේ iOS හෝ Android දුරකථනයට බ්ලූටූත් සමඟ සම්බන්ධ වේ. රෝන් පොකට් මඟින් තාපය අවශෝෂණය කර මුදා හැරීමෙන් සිසිල් වීමට හෝ උණුසුම් වීමේ පහසුකම සලසා ඇත.

# The Wearable Reading Light

කිසිවෙකුට කරදරයක් නොවී රාත්‍රියේදී ඔබට පොතක් කියවීමට අවශ්‍යද?. ගෙල වටා පැළඳිය හැකි මෙම ගැජටය මඟින් ඔබට එය නිසි ආකාරව කිරීමට සහය ලබාදෙයි. ඔබට එක් ආරෝපණයකින් පැය 16ක කාලයක් ලබාගත හැකි අතර, USB කේබලය සමඟ සම්පූර්ණ ආරෝපණයක් සඳහා පැය 2.5ක් පමණ ගත වේ.



# MEAZOR




සියලු මිනුම් සඳහා බහුකාර්යය ඩිජිටල් මිනුම් මෙවලමක් ලෙස MEAZOR උපකරකණය හැඳින්විය හැක. MEAZOR සමඟ ඔබ සිදුකරන සෑම ගණුදෙනුවක් සඳහාම දත්ත ගබඩා කිරීමේ හැකියාවද පවතී. මෙම උපකරණය මඟින් ඔබගේ කාලය, ශ්‍රමයට හොදම වටිනාකමක් නොවරදවාම ලබාදෙනු ඇත.

# LG Autonomous Robot

LG Autonomous Robot යනු අවන්හල්, නිවාස සහ සියලුම අංශ සඳහා පිරිසිදු කිරීමේ විසඳුමකි. පොදු ස්ථාන නිරතුරුවම විෂබීජහරණය කිරීම අභියෝගයකි. නමුත් මෙම උපාංගය දීර්ඝ ක්‍රියාවලියකයට ලක් කිරීමෙන් හොඳ ආරක්ෂාවක් මෙන්ම කාලයද ඉතුරු කරගත හැක. වාසනාවකට මෙන්, ඉහළ ස්පර්ශක ප්‍රදේශ විෂබීජහරණය කිරීම සඳහා

LG ස්වයංක්‍රීය රොබෝවරයා පාරජම්බුල කිරණ භාවිතා කරයි. මෙම උපාංගයට මේස, පුටු ඇතුළු වස්තූන් වටා පහසුවෙන් ගමන් කළ හැකිය. එක් ආරෝපණයකින් මිනිත්තු 15ත් 30ත් අතර කාලයක් තුළ විවිධ ප්‍රදේශ විෂබීජහරණය කළ හැකිය.



# Apple air tag

ඇපල් එයාර් ටැග් යනු ඔබ දන්නා ඕනෑම දෙයක් සොයාගැනීමට උපකාර කිරීම සඳහා ක්‍රියාකාරී උපකරණයකි. බ්ලූටූත් හරහා ඔබගේ iOS සහ macOS උපාංග සමඟ සම්බන්ධ වේ. එයාර් ටැග් නැති වී හෝ සොරකම් කර ඇත්නම්, එය සොයාගැනීමට 'ෆයින්ඩ් මයි' නමින් හඳුන්වාදී ඇති ජාලය ඔබට උදව් කරයි. එයාර් ටැග් විෂ්කම්භය අඟල් 1.26ක් වන අතර එහි උස අඟල් 0.31ක් පමණ වේ.




## bookiයෙන්











පෘථිවියේ උපත

# හාඩියන් අවධිය



පසුගිය කලාපයේදී අප ප්‍රාග් කේම්බ්‍රියානු කාලාන්තරය (වසර මිලියන 4500කට පෙර සිට වසර මිලියන 544කට පෙර දක්වා) පිළිබඳ සාකච්ඡා කළ අතර මෙවර කලාපයෙන් හාඩියන් අවධියේදී පෘථිවියේ හැසිරීම පිළිබඳව සොයා බලමු.

## වසර මිලියන 4500ට පෙර සිට - 3800ට පෙර දක්වා

පෘථිවිය තුළින් දැනට සොයාගෙන ඇති පැරණිතම පාෂාණ වසර බිලියන 3.8ක් පැරණි ඒවාය. එහෙත් චන්ද්‍රයාගෙන් හා ඇතැම් උල්කාපාතවලින් ලබා ගත් පාෂාණ කැබලි වසර බිලියන 4.5ක් පමණ පැරණි ඒවාය. මෙම සාධක උපයෝගී කොටගෙන විද්‍යාඥයින් විසින් එළඹ ඇති නිගමනය නම් මුල් වසර මිලියන 4500 සිට 3800 දක්වා වූ වසර මිලියන 800ක පමණ කාලය තුළ අපගේ පෘථිවිය ගුගුරා හැලෙමින් පැවති ලෝදිය ගුලියක්ව පැවති බවයි.

මේ යුගය තුළදී අජටාකාශයේ බහුලව පැවති ග්‍රහක හා උල්කා නිතර නිතර පෘථිවිය මතට කඩා වැටෙන්නට ඇති බවත්, එම ග්‍රහක හා ගැටීම නිසා ඇති වූ තාපය හේතුකොටගෙන පෘථිවි පෘෂ්ඨය උණු වී ද්‍රව මට්ටමින් පවතින්නට ඇති බවත් විද්‍යාඥයෝ විශ්වාස කරති. චන්ද්‍රයා මත ඇති ආවාට සංඛ්‍යාව දෙස බලන විට මෙම තත්වය තේරුම් ගැනීමට අපහසු නොවේ.

ග්‍රහක හා උල්කා විසින් චන්ද්‍රයා මත මෙන්ම පෘථිවිය මතද ආවාට ලක්ෂ ගණනාවක් බිහිකරන්නට ඇත. එහෙත් අද ඒවා අපට දක්නට නොමැත්තේ සුළඟ හා වැස්ස විසින් කාලයාගේ ඇවෑමෙන් ඒ යෝධ පියසටහන් මකා දමා ඇති හෙයිනි.

හාඩියන් යුගය මුල් භාගයේදී විශාල ග්‍රාහකයක් පෘථිවිය මත කඩා වැටෙන්නට ඇති බවත් එම ගැටීම නිසා ඉවතට වීසිවී ගිය ලෝදිය තලියක් ඝනීභවනය වී චන්ද්‍රයා නිර්මාණය වන්නට ඇති බවත් තවත් විද්‍යාඥයෝ පිරිසක් විශ්වාස කරති.

ආරම්භයේදී සූර්යයා තුළ පැවති තාපය තරම් දැඩි තාපයකින් යුත් මහා ගිනි ගුලියක්ව දැල්වෙමින් පැවති පෘථිවිය කෙමෙන් සිසිල් වන්නට පටන් ගත්තේය. සූර්යයාගෙන් දුරස්ව පිහිටීම මෙන්ම ප්‍රමාණයෙන් කුඩා ග්‍රහලොවක් වීම ද පෘථිවිය මෙසේ ඉක්මණින් සිසිල්වීමට හේතු වන්නට ඇත. ඇතැම් විද්‍යාඥයින්ගේ අදහස්වලට අනුව වේගයෙන් භ්‍රමණය වීමත්, ද්‍රව ස්වභාවයත් නිසා එය ගෝලාකාර හැඩයක්ද හිමිකර ගත්තේය.

ගුගුරා හැලෙමින්, දුම් දමමින්, කැලතෙමින් තිබූ එම මහා ද්‍රව ගෝලය කෙමෙන් සිසිල්වත්ම එහි මතුපිට ඝන පාෂාණ පටලයක් තැනෙන්නට විය. පෘථිවිය තුළින් නිකුත් වූ වායූන් හා වාෂ්ප පෘථිවියේ ගුරුත්වාකර්ෂණයෙන් මිදී යා නොහැකිව පෘථිවිය වටා රොක්ව එහි මුල්ම වායුගෝලය සැදුණු අතර එයට ඝන වලාගෝලයක් යැයි කීම වඩාත් උචිතය.

කාබන්ඩයොක්සයිඩ්, සල්පර් සංයෝග වැනි ජීවයට අහිතකර වායූන් හා ජල වාෂ්පවලින් සමන්විත වූ එම වලා පටලය යෝධ පුළුන් කුට්ටියක් මෙන් වසර මිලියන ගණනාවක් මහ පොළොව හාත්පසින්ම ආවරණය කරගෙන සිටින්නට ඇත. අභ්‍යවකාශයේ සිට අපේ ලොව දෙස බැලීමට අවස්ථාව ලැබුනේ නම් මේ අවධියේ අපට දක්නට ලැබෙන්නේ නිල් පැහැ අලංකාර ගෝලාකාර ලෝකයක් නොව සුදු පැහැති යෝධ වළාකුට්ටියක් පමණි.

හාඩියන් අවධියේදී පෘථිවියේ වායුගෝලය නිර්මාණය වූ ආකාරය මෙවර කලාපයෙන් සාකච්ඡා කළ අතර ශිලා ගෝලය සහ ජල ගෝලය නිර්මාණය වූ අයුරු අපි මීළඟ කලාපයේදී විමසමු.

---

# රැඩිකල් වෙමු!



එක අත්තක වහන්නේ එකම ජාතියේ උන්ය. ගී කියනා කිරිල්ලියකට ගැළපෙන්නේ ගී කියනා කුරුල්ලෙක් යැයි කියති. ගී කියනා කිරිල්ලියක් 'හ්ම්' කියනා බස්සෙක්ගේ අත්තක වැහිය හැකිය. එතැන් පටන් කිරිල්ලිය ගොලුවීම සහ බස්සා ගී ගැයීම අද සමාජය සාර්ථක විවාහ ජීවිතයක් සේ දකිති. නමුත් විය යුත්තේ නොවෙනස්ව දෙදෙනා පෙර පරිදිම ගී ගැයීම සහ "හම්" කීමය. අනෙක් පුද්ගලයාගේ අනන්‍යතාවය ඒ ආකාරයෙන්ම භාරගැනීම සහ ඊට බාධා නොකර සිටීම සැබෑ ආදරය වේ.

විවාහය යනු දෙදෙනෙකුට ලිංගිකව එකතුවීමට නීතිමය අවසරය ලබාගැනීමය. අනාදිමත් කාලයකට පෙර නීතියක් නොතිබුණද තමා සතු දේපලවලට නිශ්චිත උරුමක්කාරයකු නම් කිරීමේ අරමුණෙන් විවාහ සංකල්පය බිහිවිය. කෙසේවෙතත් අද වන විට විවාහය යනු විශාල සමාජමය හා සංස්කෘතික කරුණු රාශියකට වස්තු බීජයකි.

ඒ අනුව මෙතෙක් තමා ගත කළ නිදහස් ජීවිතය පසෙකලා වගකීම් සමූහයක් කරපින්නා ගැනීම සමාජය විවාහය යැයි දකිති. නිවසේ සිට උයන පියන, දරුවන් හදන ගැහැණිය හොඳම බිරිඳ ලෙසත්, අල ළූණු අරන් වෙලාසනින් ගෙදර යන පිරිමියා හොඳම සැමියා ලෙසත් සම්මානයට පාත්‍ර කිරීමට ලෝකයා බලා හිඳී.

විවාහය පැදුරක නිදාගන්නාක් සේ විය යුතුය. සැප පහසුකම් අඩු වුවද එහි අපට ස්ථායී පිහිටුමක සිටිය හැකි ය. කිසිදා බිමට වැටීමේ අවධානමක් නැත. නමුත් තමාගේ ඇති හැකියාවල් පරිදි ඇඳක සුව පහසුව අත්පත් කර ගත හැකි අතර බිමට වැටීමේ අවධානම පිළිබඳ සිහියෙන් සිටිය යුතුය.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සුදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com



## සැබෑවන සිහිනය

බිල්ලන් ලෙසයි බලයක් නැහැ අපගෙ කටේ
අල්ලන් රටම වනසා ඉදිරියද වටේ
ඉල්ලන් කන්න බැහැ සිත හා කයද ගැටේ
සෙල්ලන් නෙමෙයි නවතමු මේ ගමන රටේ

වින්ඳත් දුක් සුසුම් කරුමය පිළිගත්තූ
කැන්ඳන් ආව දෛවය ඇත සිල්ගත්තූ
සන්තොස පමණි ඕනෑ එන වෙස්ගත්තූ
ඉන්තේරුවෙන් හෙට රජවෙයි දුප්පත්තූ

සතුරන් බිඳ දමා යුධ වැදි රණ බිමට
අතු ඉති රිකිලි පවනක් වනු ඇත ඔබට
කිතු ගොස නගනු ඇති මියගිය දිනෙක හෙට
රතු මල් පිපෙනු ඇත සොහොනෙත් එක දිගට!

] **සුනීතා කිරිඇල්ල - කතරගම** [

## “ඇමතුමක් ”

පුරහඳ එබෙන විට තරුකැට හිනැහීලා
ගොම්මන හඬ තලයි තනිකම මට දීලා
නුපුරුදු නුහුරු හැඟුමක් ඇත තෙරපීලා
ටික ටික ගැහෙන හිත මට මොනවද කීවා

හරියට පෙරේදයි ගෙදරින් පිටත් උනේ
යලි එන වෙලාවක් නෑ ඇය මතක් කරේ
හැල හොල්මනක් නෑ දවසුත් ගෙවී ගියේ
අදත් රෑ වැඩද මැණිකේ වාට්ටුවේ?

දවසට දෙතුන් පාරක් ලද ඇමතුමට
පිරිමි මගෙත් හදවත රිදුනා තදට
නින්දක් නෑලු තාමත් ඇගෙ ඇස් දෙකට
උණු බත් ටිකක් කන්නට ආසලු රසට

සිරුරම වැහුනු ඇඳුමට ඇඟ කසනවලු
එහෙ මෙහෙ දුවලාම කකුලුත් රිදෙනවලු
ඉඳගෙන ඉන්නවත් ඩිංගක් ඉඩ නැතිලු
කිය කිය ඉතින් ඈ හිනහා උනු අයුරු

එලියට යනවානන් මුකවාඩම් දාලා
දවසට දෙතුන් පාරක්වත් අත් මැදලා
මං එනතුරු පැටව් දෙන්නටත් කවලා
ඉන්නට කියා ඈ දුරකතනය තිව්වා

පැත්තක දමා පැටවුන් කුසයෙන් දාව
අම්මෙක් නොවී උන් ළඟ නිති තනි ලෑව
මරුවා හිඳිද්දිත් පෙනි පෙනි ඈ ගාව
ඈ යුද වදිනවා රට වෙනුවෙන් තාම

දුටු තැන පැටව්, තන්වල කිරි එන ගැහැණු
මේ හැටි කොහොම කරගත්තද හිත දරුණු
බිරිඳක් මවක් නොව ඈ දැන් ගුණ පිරුණු
යුද සෙබලියක මෙනි අවියක් අත ගත්තු

හඬනා ජාතියට සිනහව පුදන්නට
මගෙ මැණිකේ නුඹ හෙලනා කඳුළු දැක
වරක් නෙමෙයි සියපාරක් හිතුණි මට
වැඳ වැටෙන්න නුබෙ පින්වත් දෙපා ළඟ

] **ශෂික සන්දීප් - කොරියාව** [

## අවුරුදුම කීයක්ද මගෙ මැණිකෙ නැතිවෙලා...

“ඕයි” කියනව තාම කන පුරා ඇහෙනවා...
අල්ලගන්නයි හිටියෙ සිරිමා බෝධිය ගාව
දිවිය ලෝකෙට යද්දි මඟින් රැකවල් දමා....
අවුරුදුම කීයක්ද මගෙ මැණිකෙ නැතිවෙලා?...

වෙදකමට කීය හරි ඉතින් මට ලැබෙනවා....
ඒකෙනුත් ලොකු අම්ම පින් දහම් කරනවා....
මගෙ බෙහෙත් ගල අරන් සතුන්ටත් තියනවා....
කිරි පොවලා දුක් විඳින සතුන් රැකගන්නවා....

අට පෝය සිල් ගත්ත සිල් රෙද්ද අඬනවා....
ඈ නැතුව මං කොහොම ඉන්නෙදැයි අහනවා....
ගෙදරටම නාකි වුණු ලොකු දුවත් මං හින්දා....
හැමදාම රෑට ඉකිගහනවා ඇහෙනවා....

බැරුවමයි කොටන්නත් අව් කාස්ටේ කුඹුරු....
දාපු එළවළු කඩෙත් වෙළඳාම වී සතුරු....
තුන්වේල පිරිමැහුනෙ අනේ කෙල්ලගෙ ඉතුරු....
රෙදි වියන වැඩපොලේ නැහුනේම ඇගෙ වාරු....

ඕං ඔහොමයි පුතේ ජීවිතේ ගෙවෙන්නේ....
උඹලවත් යනෙනකොට තමයි හිත හැදෙන්නේ....
හාල් පොල් නෑ වැඩිය ඔහොම හිටපං අනේ....
කෙසෙල් ඇවරියක්වත් අරන් පලයං පුතේ...

] **නුවනි කුමාරසිංහ- කුරුණෑගල** [

## සිංහරාජ, හාද?

පුතා ඉස්කෝලෙ යන හින්දා
කොටට කොණ්ඩෙ කපන්නම් නේද?
නෑ අංකල් දැන් ඉස්කෝලෙ නිවාඩුත් හින්දා
සිංහරාජ කට් එක කපමු නේද?

මොකක්ද පුතේ කීවෙ,
අලුත් කට් එකක්ද ඒක?
ඔව් අංකල් වටේ හොඳටම ගාලා
මැදින් ඉතිරි කරන එක
අලුතෙන්ම ආපු ඒක!
දන්නැද්ද අංකල් තාම?
අනේ ඒ හින්ද අංකල්
සිංහරාජ කට් එක හාද?

] **ධනංජය බණ්ඩාර** [

## ඔක්සිජන්

කන්නද ඇසූ අය
හොයයි පණදාගෙන..
ගහක් කොළකට
අතක් පයකට නැති
හෙටක් නැති රටක....
පණ නැහැගෙන දුවපු
ලාබ කෝ අද?
ලෝකෙම පුරෝගන
ධන වැද්දන් බුදින!..
අහෝ..!
බලු බළල් ගාණට
මැරී වැටෙන ජීවිත..
සුසානයක්ව හුන්තැනම..

] **බුද්ධික සම්පත් - අනුරාධපුර** [



## අකුරු හතර

ඇත්තටම ආදරය කරපු මිනිස්සු
ආදරය වෙනුවෙන් ජීවත් වුණ
හේතු හොයමින් ආදරය කළ මිනිස්සු
ආදරය ළඟ මංමුලා වූ මිනිස්සු
ආදරයේ පරාජය ලද මිනිස්සු
ආදරයට වෛර කරන මිනිස්සු
ආදරයේ ජය හිමි ඇතැම්හු
අවසන ආදරේ අකුරු හතර
“අරක්කු”

] **එරංග හර්ෂ - මහනුවර** [



# කියුබාවේ සමාජවාදය මතු පරපුරට පැවරූ පක්ෂ සමුළුව



කොවිඩ් වෛරසය මේ වන විට සමස්ත ලෝකයේම ධනවාදය දුබලකම මෙන්ම දේශප්‍රේමී සළුපිළි හැඳගෙන සිටි ධනපති පාලකයන්ද නිරුවත් කොට ඇත. ලෝක ධනවාදයට තවදුරටත් ඉදිරියට ගමන් කළ නොහැකි බව උදාහරණ සහිතව පෙන්වාදීමට මෙම කොවිඩ් 19 වසංගතයට හැකි විය. ධනවාදය නැවත නැවතත් එහි අසාර්ථකබව තහවුරු කරමින් සිටින කලෙක ලෝවැසි සියලුදෙනාම තම ජීවිත සැබෑ ලෙස සුරැකිය හැකි මානවවාදී සමාජ ක්‍රමයක් අයැද සිටී. එවන් මොහොතක සමාජවාදී කියුබාව, වියට්නාමය වැනි රටවල් මානව ප්‍රේමය, සහයෝගීතාවය ප්‍රමුඛ කොටගත් සමාජ-ආර්ථික ක්‍රමයක් අනුගමනය කරති. ඇස්පනාපිටම එහි ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටිති.

ප්‍රබල ආසියාතික ධනවාදී රටක් වන ඉන්දියාවේ දෛනික කෝවිඩ් ආසාදිත සංඛ්‍යාව ලක්ෂ තුන ඉක්මවමින් පවතින අතර දෛනික කෝවිඩ් මරණ සංඛ්‍යාව තුන්දහස ඉක්මවා යයි. ඉන්දියාව එලෙස අසාර්ථක වෙද්දී මිලියන 98කට ආසන්න ජනගහනයක් සිටින ආසියානු රටක් වන සමාජවාදී වියට්නාමයෙන් මේ වනවිට වාර්තා වී ඇත්තේ රෝගීන් 2,910ක් හා සමස්ත මරණ 35ක් පමණි. එය ආසියාවේ හොඳම වාර්තාවලින් එකකි.

එසේම ලොව විශාලතම ඖෂධ නිෂ්පාදනය කරන රටක් මෙන්ම කොවිඩ් 19 සඳහා එන්නත් නිෂ්පාදනය කරන ප්‍රමුඛ පෙළේ රටක් වන ඉන්දියාව තම පුරවැසියන්ගේ ජීවිත බේරාගැනීමට නොහැකි තත්වයකට අද පත්ව සිටියි. මේ වන විට covid-19 වසංගත තත්වයෙන් මෙන්ම එක්සත් ජනපදයේ දැඩි ආර්ථික සම්බාධක හමුවේ සමාජවාදී කියුබාව දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දී සිටියද covid - 19 වෛරසය සඳහා එන්නත් නිෂ්පාදනය කරන ලතින් ඇමරිකානු කලාපයේ එකම රට කියුබාවයි. එසේ නම් අසාර්ථක ධනවාදය ඉදිරියේ ඇස්පනාපිටම සමාජවාදය ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටී. කියුබාවේ සමාජවාදය මතු පරපුරට දායාද කරමින් සිටී.

කියුබානු කොමිනිස්ට් පක්ෂයේ අටවැනි පක්ෂ සමුළුව ලෝක ධනවාදයට එරෙහි සමාජවාදයේ ඉදිරි ගමනේ නව්‍යත්වයේ පිළිබිඹුවයි. මෙහි තේමාව එක්සත්භාවය හා අඛණ්ඩතාවයයි. එනම් සමාජවාදී ඉදිරි ගමනයි.

කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ සමුළුව ප්‍රධාන අරමුණු තුනක් මුල් කරගනිමින් කැඳවා තිබුණි. කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ හත්වෙනි සමුළුවේ සිට රටේ සමාජ-ආර්ථික සංවර්ධනය ඇගයීමට ලක්කිරීම, වර්ධනය වී ඇති දේශපාලන හා ආර්ථික වෙනස්කම් සැලකිල්ලට ලක්කරමින් රටේ සමාජය ආර්ථික සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. දෙවන අරමුණ වූයේ පසුගිය සමුළුවේදී පක්ෂ සාමාජිකයන් වෙත පවරන ලද ඉලක්ක හා විවිධාකාරයේ පක්ෂ කටයුතු ඇගයීමට ලක්කිරීමයි. එමෙන්ම විප්ලවයට අත්‍යවශ්‍ය ඉලක්ක අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා තරුණ පක්ෂ ක්‍රියාකාරීත්වයත් සංවර්ධනය කිරීම හා නව සාමාජිකයන් සම්බන්ධ කරගැනීමයි. රජයේ කටයුතුවලදී මෙන්ම ආණ්ඩුවේ කටයුතුවලදී හා බහුජන ව්‍යාපාරයේ කටයුතුවලදී පක්ෂ ක්‍රියාකාරීත්ව කටයුතු විශ්ලේෂණය කිරීම තෙවන අරමුණයි.

කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ නව ප්‍රධාන ලේකම්වරයා ලෙස මිගුවෙල් ඩියස් කොනෙල් තෝරා පත්කරග න්නා ලදී. නව නිලධාරි මණ්ඩලය පත්වීමත් සමඟ කොමියුනිස්ට් හා සමාජවාදී කියුබාවේ නායකත්ව කාර්යභාරය ප්‍රථමවරට විප්ලවයේ ඊළඟ පරම්පරාවට පැවරීම සිදුවිය.

නමුත් ධනපති මාධ්‍යයන් සමුළුව පිළිබඳ විකෘති අර්ථකථනයන් දක්වමින් සිටී. එක් පාලකයෙකු හෝ පාලක කණ්ඩායමක් වටා බලය තබාගැනීමේ උන්මාදයෙන් පෙළෙන ධනපති පාලකයන් කැස්ත්‍රෝ පවුලෙන් කියුබාවේ බලය ගිලිහීම සමාජවාදයේ අවසානයැයි මොරදෙන්නේ මේ නිසාය. මෙය කැස්ත්‍රෝ පාලනයේ අවසානය නොවේ. කියුබානු සමාජවාදී විප්ලවය තවදුරටත් අඛණ්ඩව හා සුරක්ෂිතව ඉදිරියට ගෙනයාමකි.

එසේ නම් අනාගත ලෝකය ගමන් කළ යුත්තේ සාධාරණත්වය සමානාත්මතාවය හා සහෝදරත්වය රජයන සමාජයක් දෙසටය. ඒ සඳහා විකල්ප දේශපාලනයක් සඳහා ලෝකය පෙළගැස්වීමට කාලය පැමිණ තිබේ.

# මියන්මාර් හමුදාව හා ජනතා ගැටුම්



මියන්මාර් හමුදාවට එරෙහිව ක්‍රියාත්මක වූ ජනතා ගැටුම් තවමත් උණුසුම් වෙමින් පවතී. මියන්මාරයේ නැවත ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවා අත්අඩංගුවේ පසුවන අවුන් සාන් සුකී ඇතුළු පිරිස නිදහස් කරන ලෙසට විරෝධතා කරමින් එරට ශිෂ්‍යයෝ, ගුරුවරු, රාජ්‍ය සේවකයෝ, නීතිඥයෝ ආදී විශාල පිරිසක් එක්ව සිටී. මෙම විරෝධතා, හමුදාව විසින් ජීව උණ්ඩ යොදා ගනිමින් මර්ධන කරමින් සිටී. මේ වන විට මරණ 550ක් හා සිරගත කිරීම් 2500ක් වාර්තා වී ඇත. තවද, සුළු ජාතිකයින් වැඩි වශයෙන් සිටින ප්‍රදේශවලට හමුදා ප්‍රහාර එල්ල කරමින් සිටී. මේ නිසා රටෙහි සුළු ජාතික කණ්ඩායම් 20කට වැඩි පිරිසක් හමුදාවට එරෙහිව සටන් කිරීමට ප්‍රවණතාවයක් දක්වා තිබේ.

# එංගලන්තයේ නව අපරාධ පනතක්



එංගලන්තයේ වර්තමානයේ පවතින විරෝධතා පාලනය කිරීමට නව පනතක් යෝජිනා කර ඇත. මේ සම්බන්ධව එරට දහස් ගණනක ජනතාවක් විරෝධය පළකරමින් සිටී. මෙම පනත නම්කර තිබෙන්නේ පොලිස්, අපරාධ, දණ්ඩනය සහ අධිකරණ පනත ලෙසයි. මෙම පනතින් පොලිසියට විරෝධතා රැළි, පෙළපාලි, මත කොන්දේසි පැනවීමට ඉඩ ලබාදේ. එනම් ඒවා ආරම්භ කරන වේලාව, ස්ථානය, ශබ්ද මට්ටම තීරණය කිරීමට ඉඩ ලබාදී තිබේ. මෙම පනත මගින් විරෝධතා මර්ධනයට වැඩි බලයක් ලබා දෙන බවත් සමානාත්මතාවය හා සාධාරණ නඩු විභාගයකට ඇති ඉඩ සීමා කරන බවත් විරෝධතාකරුවන් වැඩිදුරටත් පවසා සිටියි.

# ගුවන්තනාමෝ බේ කඳවුර වසා දැමේ!




කියුබාවේ පිහිටි ඇමරිකා එක්සත් ජනපදයට අයත් ගුවන්තනාමෝ බේ සිර කඳවුර වසා දැමීමට එහි බලධාරීන් පියවර ගෙන ඇත. මෙම කඳවුර camp 7 ලෙස හඳුන්වා ඇත. මෙහි සිටි සිරකරුවන් සියලුදෙනා camp 5 ලෙස හඳුන්වන ස්ථානයකට යවා ඇත. 2006 වසරේදී ස්ථාපිත වූ මෙම කඳවුර ඉතාමත් රහසිගතව පවත්වා ආ අතර මාධ්‍යට පවා එය නිරාවරණය නොකරන්නට එහි බලධාරීන් පියවර ගෙන තිබුණි.

# 2020 දී චීනයේ විදෙස් ආයෝජන 81%කින් ඉහළට



චීනයේ 2020 වසරේදී හිමිවූ විදෙස් ආයෝජන ප්‍රමාණය 2019 ආයෝජන වටිනාකමින් 81%කින් වැඩිවී ඇත. කොවිඩ් 19 තත්ත්වය හමුවේ වුවද ශක්තිමත්ව ව්‍යාපාරික වපසරිය පෙන්වීමට එරට බලධාරීන් සමත් වූ බව පවසා ඇත. එය ඩොලර් බිලියන 520.6ක් බව එරට පාලනාධිකාරිය පවසයි. 2020 වසරේදී චීනයේ සුරැකුම්පත් වෙළඳපොළද ඇමරිකානු ඩොලර් 254.7ක් වටිනා විදේශ අරමුදල් ගලා ඒමක් වාර්තා කර තිබේ. එසේම චීන සුරැකුම්පත් සඳහා විදේශ ආයෝජනද ඇමරිකානු ඩොලර් බිලියන 190.5ක් බවට පත්ව තිබිණි.

ආගම බිහිවීම-05 කොටස

**පසුගිය කලාපයෙන් අප ඔබ වෙත ගෙන එනු ලැබුවේ ක්‍රිස්තියානි ආගම බිහිවීම සහ ජේසුතුමාගේ උපතයි. අද ඔබට ගෙන එනු ලබන්නේ ක්‍රිස්තියානි ආගම බිහිවීම සඳහා ජේසුතුමාගේ ඉගැන්වීම් සහ කිතු දහමේ ව්‍යාප්තියයි.**



# ක්‍රිස්තියානි දහම

## ජේසුතුමාගේ ඉගැන්වීම්

යේසුතුමා උප්පත්තිය ලැබූ ඊශ්‍රායල් දේශයේ එතෙක් පැවති ආගමික, සමාජීය බලපෑමද මෙම කිතුදහම ව්‍යාප්තිය සඳහා පිටුවහල් වූ අතර ඒ සඳහා යුදෙව් ආගමෙන් සිදු වූ බලපෑම බොහෝ ය. කතෝලික ආගම ගොඩනැඟී ඇත්තේ යුදෙව් ආගමේ සංකල්ප තුළිනි. ඊට හේතුව යේසුතුමා ජීවත් වන කාලයේ ප්‍රධාන ආගම වූයේ යුදෙව් ආගම සහ රෝමවරුන්ගේ බහුදේවවාදයන් ය. විශ්වය, පෘථිවිය, සහ මිනිසාව මැවීම ඒකදේවවාදය, ස්වර්ගය සහ නිරය වැනි ප්‍රධාන සංකල්පද කතෝලික ආගමට පැමිණියේ යුදෙව් ආගමෙනි. යොහොවා විසින් ඊශ්‍රායෙල්වරුන්ට විශේෂයෙන් තෝරාගත් අය ලෙස නම් කරන ලදී. ඔවුන් ලෝකයට නායකත්වය දෙන සහ ලෝකය බේරාගන්නා අරුත ඇති පිරිසක් ලෙස නම් කරන ලදී.

බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ අන්තර්ගත සියලු දෑ යුදෙව්වාදය පිළිබඳව වන අතර නව තෙස්තමේන්තුවේ ජේසුතුමාගේ ජීවිතය පිළිබඳ තොරතුරු සහ එතුමාගේ ඉගැන්වීම් අන්තර්ගත වී ඇත. විශ්වයේ සත්ව වර්ගයාගේ මැවුම්කරුවා දෙවියන් වහන්සේ බව ජේසුතුමා ඉගැන්වීය. දෙවියන් වහන්සේගේ සතුරා සාතන් වේ. තවද දෙවියන් වහන්සේ අනුකම්පා සහගත වන අතර සියලු දෙනාට එකසේ කරුණාව දක්වයි. සියලු දෙනා සහෝදරත්වයෙන් ජීවත් විය යුතු අතර දෙවියන් වහන්සේ වෙනුවෙන් කැපවී සිටිය යුතු බවත් ඔහු දැන්වීය. පව්කාරයින් සිය පාපකර්ම පිළිබඳව පසුතැවිලි විය යුතු අතර දෙවියන් වහන්සේගේ අනුකම්පාව සඳහා යාඥා කළ යුතු බවද යහපත් ක්‍රියාමාර්ගවල යෙදීමෙන් පාරිශුද්ධ චරිත ගොඩනඟා ගත යුතු බවද ඔහුගේ ඉගැන්වීම්වලින් කියාදුනි. තමාට නපුරක් කරන අයට වුවද යහපතක් කිරීමට මනුස්සයා යොමු විය යුතු බව අවධාරණය කළ ඔහු වරදට සමාවදීම පුණ්‍යකර්මයක් බව දක්වා ඇත. කුරුසයේ ඇණ ගසා සිටියදී වුව ඔහු "පියාණනි, ඔවුන්ට සමාවෙන්න. මේ කරන්නේ කුමක්දැයි ඔවුන් නොදන්නාහුය." යැයි පවසා තමාට මරණ දඬුවම පැමිණ වූ අයට සමාව දුන් බව කියනු ලැබේ. ජේසුතුමා ගම්බද ජනතාවට පහසුවෙන් අවබෝධවන භාෂාවෙන් උපදේශ කතාද සහිතව තම ධර්මය පැහැදිලි කළේය. ඔහුගේ ශ්‍රාවකයෝ ජේසුතුමා දෙවියන් වහන්සේ විසින් එවන ලද ගැලවුම්කරුවා ලෙස සළකමින් ගරු සම්මාන දැක්වූහ.

ජේසුතුමා ධනය සහ අනිකුත් සැප සම්පත් නිගරු කොට සළකන ලෙස සිය අනුගාමිකයන්ට උපදෙස් දුන් අතර දුප්පත් සහ පීඩිත ජනතාවට සාධාරණත්වය, යුක්තිය, ආදරය සහ සමෘද්ධිය ඇති දෙවියන්ගේ රාජධානිය ළඟා කරදීමට පොරොන්දු විය. තවද සහෝදරාත්මක ආදරය, අනුකම්පාව, දයාව, ධාර්මික ජීවිතය, යහපත් පැවැත්ම, නිහතමානිකම සහ මනුෂ්‍යත්වය වැනි යහගුණ ප්‍රගුණ කරන ලෙස සිය අනුගාමිකයන්ට ඉගැන්වීය. සිය අනුගාමිකයන් සඳහා දේශනා කළ අධ්‍යාත්මික පණිවිඩය කන්ද උඩ දේශනය නමින් හැඳින්වෙන අනුශාසනාවක් ලෙස ඉදිරිපත් කොට ඇත.

## කිතුදහමේ ව්‍යාප්තිය

ජේසුතුමා කුරුසියේ තබා ඇණ ගැසීමෙන් පසුව අපෝසතලුවරුන් වශයෙන් හැඳින්වෙන ඔහුගේ ශ්‍රාවකයෝ දොළොස්දෙනා විසින් යුදෙව්වන්ට ධර්මය දේශනාකිරීම ආරම්භ විය. ජේසුතුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන බවත් දෙවියන් වහන්සේ විසින් ලෝකයට එවන ලද ගැලවුම්කරුවා බවත් ඒ නිසා ඔහුගේ අනුකම්පාව සහ කරුණාව අයැද සිටීමෙන් විමුක්තිය ළඟාකර ගත හැකි බවත් ඔවුහු දේශනා කළහ. බොහෝ යුදෙව්වන් කිතුදහමට හරවාගැනීමට ඔවුහු සමත් වූහ.

එසේ අලුතින් කිතුදහම වැළඳගත් පෝල් නැමැත්තා රෝම අධිරාජයේ සිට යුදෙව්වන් නොවන අයට දේශනාකිරීම ආරම්භ කළේය. දුප්පතුන් සහ වහලුන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත්වූ ඔහු එවැනි පීඩිත ජන කොටස් විශාල ලෙස කිතු දහමට හරවා ගැනීමට සමත් විය. රෝම පාලකයෝ ඔහුව අත්අඩංගුවට ගෙන රෝමයට රැගෙන ගොස් ක්‍රිස්තු වර්ෂ 60 දී පමණ මරා දමන ලදී. පසුව ඔහුව සාන්තුවරයකු ලෙස නම් කරන ලදී. කිතුදහම වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කිරීම හේතුකොට බොහෝදෙනා කිතුදහම වෙත ඇදී ආ අතර එමඟින් රෝම අධිරාජ්‍යය තුළ කිතුදහම ව්‍යාප්ත වීමට පදනම වැටුණි.

එසේ කිතුදහමට විරුද්ධ වූ රෝම පාලකයන් විසින් කිතුණු බැතිමතුන් විනාස කර දමන ලදීග ආගම වෙනුවෙන් දිවිපිදූ සංඛ්‍යාව වැඩිවෙත්ම කිතුදහම සීඝ්‍රයෙන් ජනප්‍රියවන්නට විය. අධිරාජයා වන්දනා කිරීම ප්‍රතික්ෂේප කළ ක්‍රිස්තු භක්තිකයෝ අධික බදු අයකිරීම සහ කඩුගත් මල්ලවපොරවලටත් විරුද්ධත්වය දැක්වූහ. ඔවුහු හමුදාවේ සේවය කිරීම ප්‍රතික්ෂප කළහ. රෝමය ගිනිගත් අවස්ථාවේ නීරෝ අධිරාජයා එහි වරද පැවරුවේද ක්‍රිස්තු භක්තිකයන් වෙතය. ක්‍රිස්තු භක්තිකයන් විශාල වශයෙන් අල්ලා කුසගින්නේ පෙළෙමින් සිටි සිංහයන් වෙත වීසිකර දමන ලදී. එහෙත් මේ කිසිදු ක්‍රියාමාර්ගයකින් කිතුදහම මර්දනය කිරීමට නොහැකි විය. ඒ වෙනුවට සිදුවූයේ පැරණි රෝම ආගම් කෙරෙහි කලකිරීමට පත්ව සිටි බොහෝ දෙනා කිතුදහමට ඇදී ඒමත් යේසුස්ගේ අදහස් මල්ඵල ගන්වමින් රෝම පරිපාලනය පරිහානියට පත්වීමත්ය. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස පමණ වන විට රෝම අධිරාජ්‍යයේ සියලු ප්‍රදේශවල සහ මුළු ආසියාතික ප්‍රදේශවලද කිතුදහම ව්‍යාප්ත විය.




# පාපැදි නගරය
## ඩෙන්මාර්කයේ කොපෙන්හේගන්

ඕනෑම රටක දේශපාලකයා තමයි ඒ රට අනාගතයේදී තියෙන්න ඕන කොතැනද කියල තීරණය කරන මිනිහා. නැත්නම් රටක තීරණාත්මක ප්‍රපංචය. ඔහුට ඒ සඳහා හොඳ දැක්මක්, අතිවිශාල ධෛර්යයක්, අවංකත්වයක් හා විනිවිදභාවයක් තිබිය යුතුයි. එහෙම දේවල් නැති හිස් දේශපාලකයො ඉන්න රටවල් තියෙන්නෙ දුගී රේඛාවෙන් පල්ලෙහා. අපි අපිටම කියාගත්තොත් එහෙම රටවල්වලට කියන්නෙ පසුගාමී ආර්ථික රටාවක් සහ පසුගාමී සමාජයක් තියෙන රටවල් කියලා. ඒක නිසා තමයි අපේ දේශපාලකයා තමන්ට අතිසුඛෝපභෝගී රථ දෙක තුනක් තියාගෙන ඒකට ආරක්ෂාවට තවත් රථ පෙළක් තියාගෙන ඉන්නේ. එයා එහෙම ඉන්නකොට රටේ පොදු ජනතාව අතින් කටින් එල්ලගෙන, පොල් පැටෙව්ව වගේ මිනිස්සු පටවපු පොදු මාර්ග ප්‍රවාහනයේ සහ එහි පාපුවරුවේ තනි කකුලෙන් එල්ලිලා යන්නේ. අපි දැන් කතාකරන්න යන්නෙ පොදු ජනතාව එහෙම මාරාන්තික ගමන් බිමන් නොයන ප්‍රවාහන ක්‍රමයක් ඇති රටක් ගැන..

ඕනෑම ආර්ථික, මානව හෝ සංස්කෘතික දර්ශකයක් අරන් බැලුවොත් අපිට පේනවා ඩෙන්මාර්කය කියන්නෙ මිනිහෙක්ට සතුටෙන් ජීවත්වෙන්න පුලුවන් රටක් විදිහට ඒ දර්ශකවල ඉහලින්ම තියෙන රටක් බව. ඒ වගේම ඒ රට දැඩි මානව හිතකාමී පරිසරයන් සහිත රටක් බව. අපි දැන් කියන්න යන්නෙ ඒ රටේ තියෙන පා පැදි සංස්කෘතිය ගැන...

මේ බයිසිකල් ප්‍රවාහන සේවයට බලපාපු මූලිකම කාරණාව තමයි, ඩෙන්මාර්ක නගර පිහිටලා තියෙන භූමියේ පැතලි බව සහ 1970දී ලෝක තෙල් අර්බුදයේදී ඩෙන්මාර්ක් ජනතාව විඳි අන්ත දුක. එයාල නගරවල වීදිවලට බැහැලා 'අපි තෙල් ගහගන්නම්, අපිට වාහන නිකන් දියව්' කියලා දැවැන්ත විරෝධතාවයක නිරත වුණා. මොකද ඩෙන්මාර්කය කියන්නේ ඉන්ධනවලට හා මෝටර් රථවලට අධික බදු ගහන රටක්. අවුරුදු 100ක් විතර පැරණි මේ පාපැදි ප්‍රවාහන ක්‍රමය නැවත ඉක්මණින්ම ජනතාව අතරට එන්න හේතු වුණේ ඒකයි. 2018 වෙනකොට මේ පාපැදි ප්‍රවාහන ක්‍රමය මොනතරම් තීරණාතමක කාර්යයක් කළාද යත් ඩෙන්මාර්කයේ පොදු ජනතාවගේ සමානාත්මතාවය සහ නිදහස පිළිබඳ සංකේතයක් පාපැදියකින් ගමන් බිමන් යන මිනිහා වුණා. අපේ රටේ තමන්ටම කියලා මෝටර් රථයක් තියෙනවා කියන්නේ ඒ මිනිහගේ සුඛෝපභෝගී ජීවිතය හෝ ඒ මිනිහාගේ සමාජ ස්ථරය පිළිබඳ සාධකයක් වුණාට ඩෙන්මාර්කයේ කවදාවත් ඒක එහෙම නෑ.



කොපෙන්හේගන් තමයි ඩෙන්මාර්කයේ අගනුවර. කොපෙන්හේගන්වල ජීවත් වන බහුතර ජනතාවකට තමන්ට කියල මොටර් රථයක් නෑ. ඒ නැත්තෙ එයාලට මෝටර් රථයක් ගන්න සල්ලි නැති නිසා නෙවෙයි. ඊට වඩා වියදම් අඩු සහ පහසුකම් සහිත ප්‍රවාහන සේවයක් සහ ක්‍රමයක් තියෙනවනම් පුද්ගලිකව මෝටර් රථයක් තියාගෙන මොනවටද? ඒ නගරේ 54%කගේ ප්‍රවාහන ක්‍රමය තමයි පාපැදිය. ඊට අමතරව එක දවසකට කොපෙන්හේගන්වලට ඇතුලු වන සහ පිටවන පාපැදි සංඛ්‍යාව පනස් දහසකට වැඩියි. ඒත් ඒ තරම් මෝටර් රථ සංඛ්‍යාවක් ඒ නගරයට දවසකට ඇතුලුවෙන්නෙ නෑ.

මේ පාපැදි සංස්කෘතිය තුළින් ඩෙන්මාර්කය භුක්ති විඳිනවා අවම මෝටර් රථ සංඛ්‍යාවක් නිසා වායුගෝලය එකතුකරන අවම කාබන් වායුව සහිත හොඳ හුස්මක්. අවම නලා ශබ්දය නිසා ඉතා හොඳ ශබ්දය විරහිත පරිසරයක්. ඒ වගේම අධික මෝටර් රථ තදබදයක් නොමැති නිසා නිෂ්පාදන ආර්ථිකයට ඒ සඳහා ඉන් එකතුවන පැය ගණන. ඉන්ධනවලට වැය කරන විදේශ විනිමය ප්‍රමාණය සහ එය අවම වී එම මුදල් රටේ වෙනත් සංවර්ධන ව්‍යාපෘතියකට යෙදවිය හැකිවීම සහ මේ තුළින් ඩෙන්මාර්කයේ සියලු නගර හරිත නගර බවට පත්කිරීමට හැකිවන උත්සාහයට සපයන නොමසුරු දායකත්වය.

හොඳම කාරණය තමයි මේ සියල්ලටම පළමුව දායකත්වය දෙන්නේ ඒ රටේ දේශපාලකයා සහ ඔහුගේ ආදර්ශයයි. ඩෙන්මාර්කයේ දේශපාලකයන් 70%ක් එරට පාර්ලිමේන්තුවට එන්නේ පාපැදි වලින්. අපිට ඒක විශ්මයට කාරාණාවක් වුවත්, සමහර විටෙක අගමැති පවා! උදෑසන හත වෙද්දී කොපෙන්හේගන් මාර්ගවල ටයි කෝට් දා ගත්තු ව්‍යාපාරික මහත්වරුද, විවිධ විලාසිතාවලින් සැරසිලා දිනපතා වැඩට යන කාන්තා පක්ෂයද, පාසැල් නිල ඇඳුම දා ගත්තු දරුවෝද පාපැදිවල නැගිල දස දහස් ගණන් යනවා අපිට බලන්න පුලුවන්.

මේ පාපැදි ප්‍රවාහන ක්‍රමයේ තියෙන සුවිශේෂිත්වය තමයි, මෝටර් රථයකින් ගමන් කරනවාට වඩා ඉක්මණින් පාපැදියකට පුලුවන් තම ගමනාන්තයට යන්න. එහේ මංමාවත් හදලා තියෙන්නේ ඒ විදිහටයි. 2012 කොපෙන්හේගන් මාර්ග සංවර්ධන අධිකාරිය හදනව පාපැදිවලට පමණක් ගමන් කළ හැකි මංතීරු 26ක් තියෙන අනර්ඝ මහා මාර්ගයක්. ඒ එක මංතීරුවක අවම දුර කිලෝ මීටර් 24ක්.

ඩෙන්මාර්ක මව්වරු තමන්ගෙ දරුවට පාපැදිය පුහුණු කරන්න ගන්නේ එයාට වයස යන්තන් අවුරුදු 3ක් වෙනකොට කියලයි කියන්නෙ. ඒකෙ ප්‍රතිඵලය තමයි කුඩා දරුවගේ සෑම මාංශ පේශියක්ම හොඳින් චලනය වී ශක්තිමත් වී නිරෝගීමත දරු පරපුරක් ඩෙන්මාර්කයට උරුම වීම. 1960 වෙනකොට ඩෙන්මාර්කයේ මහාමාර්ග ඉල්ලා සිටියේ මෝටර් රථවලට ඉඩදීල පාපැදි පැත්තකට විය යුතුයි කියලා. එත් 2018දී ඒ මහාමාර්ග පද්ධතියම ඉල්ලා සිටිනව පාපැදිවලට ඉඩදීල මෝටර් රථ මාර්ගයෙන් ඉවතට යා යුතුයි කියලා. ඔබට බලන්න පුලුවන් කොපෙන්හේගන් නගරයේ ඇති විවිධ ප්‍රචාරක පුවරු අතර මෙහෙම ප්‍රචාරක පුවරුත් තියෙනවා.

"කොපෙන්හේගන් අහස පාපැදිවලට ආදරය කරයි"

"පාපැදි නගරයක ඔබ ජීවත්වනවා යනු වයස අවුරුදු 100ක් ජීවත් වෙන බවයි"

"විදේශිය අමුත්තනි, පාපැදියකින් සංචාරය කර කොපෙන්හේගන් අසිරිය විඳින්න"

"පාපැදිය නිරෝගී මතු පරපුරක් බිහිකරයි"

] උපාලි ජයසිංහ [

ඒ පාරෙත් මේ පාරට...

# වසංගත හමුවේද පණ ලබන සමාජවාදය (වියට්නාමය)



මේ සමාජවාදී වියට්නාමයයි. කොරෝනා වසංගතය හමුවේ මුලුමහත් ලෝකයක් දෑස්මානයේම ඇදවැටීමට ලක්ව ඇති කාලවකවානුවක සමාජවාදී වියට්නාමය නොසැලී සිටී!...

ලොව ප්‍රබලයෙකු වන ඇමෙරිකා එක්සත් ජනපදයද මේ වනවිට කෝටි තුනකට අධික ආසාදිත පිරිසක් සහ ලක්ෂ පහකට අධික මරණ සංඛ්‍යාවකට හිමිකම් කියයි. එවන් වූ වටපිටාවක මිලියන 96ක ජනතාවක් සිටින සමාජවාදී වියට්නාමයේ ආසාදිත රෝගීන් 2857ක් පමණක් වූ අතර අහිමි වූ ජීවිත සංඛ්‍යාව 35කට සීමාකරගැනීමට එරට සමත්විය....

අතිසාර්ථක ලෙස කොවිඩ් වසංගතය සිය පාලනයට නතුකරගත්තාක් සේම මුලු ලොවම ආර්ථිකමය ප්‍රපාතයකට ඇදවැටෙද්දී ඉන් බේරී දරාසිටීමට තරම් සමාජවාදී වියට්නාමය සවිමත් වී ඇත්තේ ධනවාදය නිරුත්තර කරමිනි. 2020 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය සියයට -5.6ක් ලෙස ඍණාත්මකව පල්ලම් බසිද්දී කැපීපෙනෙන ලෙස සමාජවාදී වියට්නාමයේ දළ දේශීය නිෂ්පාදිතය 2020 දී සියයට 2.9කින් වර්ධනය විය.. එය සිදු කළ ලෝකයේ රටවල් අතලොස්සෙන් එකක් බවට වියට්නාමය පත්වන්නේ මුලු ලොවම මවිත කරමිනි...

දේශීය නිෂ්පාදිතයේ වර්ධනය මෙන්ම වියට්නාමය 2020 වසරේදී එරට මෙතෙක් වාර්තා කර ඇති ඉහළම වෙළඳ භාණ්ඩ අතිරික්තය වාර්තාකළේය. එපමණක් නොව ජාත්‍යන්තර සංචිතවල වැඩිවීමක්ද වාර්තා කිරීමට සමාජවාදී වියට්නාමයට හැකිවිය. විදේශ ආයෝජන අඛණ්ඩව ගලා ඒම සහ වෙළඳ අපනයනවල අඛණ්ඩ වැඩිවීම තුළින් ඔවුන් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විදේශ විනිමය ඉපැයීම්වල සිදුවූ අලාභද මකාදැම්මේය...

කවර අසීරු අවස්ථාවක්දී වුව නිවැරදි හා දූරදර්ශී ආර්ථිකමය ප්‍රතිපත්ති මඟින් සිය පුරවැසියාට ආර්ථික සුරක්ෂිතභාවය ලබාදීමට සමාජවාදය සමත් යැයි ලොවට පසක්කළ සමාජවාදී වියට්නාමයේ ආර්ථිකය 2021 දී සියයට 6.6 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ...

වමට

# තාක්ෂණය යනු කුමක්ද?



තාක්ෂණයේ දියුණුව ඉතා ඉහළ ස්ථානයකට පැමිණ තිබෙන අතර එය ඉතා වේගයෙන් වර්ධනය වන යුගයක අපි ජීවත් වෙමු. මෙය විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණයේ පිම් පනිමින් ඉදිරියට යන යුගයකි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේදී ඩිජිටල් තාක්ෂණය සොයාගැනීම එහි විප්ලවීය වෙනසක් ඇති කොට තිබේ. මෙය ඩිජිටල් යුගය ලෙස හඳුන්වන්නේද මේ නිසාය. කෙසේ වුවත් මානව සමාජය තුළ මහා ප්‍රාතිහාර්ය පෑමට සමත්ව ඇති තාක්‍ෂණය හඳුනාගැනීම වැදගත්ය.

තාක්ෂණයේ ගමන් මග විමසා බැලීමේදී තාක්‍ෂණය යනු කුමක්දැයි නිවැරදිව වටහාගැනීම වැදගත්ය. තාක්ෂණය ඉංග්‍රීසියෙන් හඳුන්වන technology යන වචනය 17 වන සියවස ආරම්භයේදී technologia යන ග්‍රීක වචනයෙන් බිඳී ආවකි. තාක්ෂණය පිළිබඳව ඉතාම සමාන අදහස් ඇති නිර්වචන කිහිපයක් තිබේ. ඒවා නම් "විද්‍යාත්මක දැනුම, ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සඳහා, විශේෂයෙන්ම කර්මාන්ත සඳහා යොදාගැනීම" ලෙසත් "විද්‍යාත්මක දැනුම මඟින් සංවර්ධනය කරගත් යන්ත්‍ර හා මෙවලම්" ලෙසත් "ඉංජිනේරු හා ව්‍යවහාරික විද්‍යාව සමඟ කටයුතු කිරීමේ දැනුමේ පාර්ශවයක් ලෙසත්" සඳහන් වෙයි. කෙසේ වෙතත් පොදුවේ ගත් විට තාක්‍ෂණය යනු "විද්‍යාත්මක දැනුම ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සඳහා විශේෂයෙන් නිෂ්පාදන ක්‍රියාකාරීත්වය සඳහා යොදාගැනීම " ලෙස හඳුනාගත හැකිය. විද්‍යාවේ ශරීරය තාක්‍ෂණය ලෙස පිළිගැනේ. විද්‍යාව හා තාක්ෂණය එකට සම්බන්ධව යෙදෙන වචනයන් වී ඇත්තේ ඒ නිසාය.


විද්‍යාව හා තාක්ෂණය විශේෂයෙන්ම තාක්ෂණය මානව වර්ගයාගේ නිෂ්පාදන ක්‍රියාකාරීත්වය සමඟ බැඳී පවතී. එබැවින් අපට තාක්ෂණයේ බිහිවීම පිළිබඳ කතා කිරීමට සිදුවන්නේ මිනිසාගේ බිහිවීමත් සමඟය. මානව කල්ප වානර ප්‍රභේදයකින් පරිණාමය වූවා යැයි විශ්වාස කෙරෙන මිනිසා සිය පරිණාමීය ක්‍රියාවලියේදී සතුන්ගෙන් වෙනස්ව මිනිසා බවට පත්වන්නේ මිනිසා තුළ වර්ධනය වූ සතුන්ට නැති විශේෂ ලක්ෂණ කිහිපයක් නිසාය. ඒවා නම් යැපීමේ මාධ්‍යයක් ලෙස නිෂ්පාදනය කරගැනීම සඳහා වූ ශ්‍රමයේ හැකියාව, මතක තබා ගැනීමේ හා තර්කන හැකියාව සහිත විඥානය හා අදහස් හුවමාරු කර ගැනීමේ දියුණු අවස්ථා වන භාෂාව වේ. සිය යැපීමේ මාධ්‍යන් සොයාගැනීම සඳහා වූ සතුන්ගේ දෑතේ සරල ක්‍රියාකාරීත්වය මිනිසා තුළ ශ්‍රමය බවට පරිණාමය වූයේ මිනිසා ඉතාම සරල මට්ටමේ වූ උපකරණ භාවිතය ඇරඹීමත් සමඟය. එනම් සතුන් විසින් සිදුකළ ආහාර සොයාගැනීමේ ක්‍රියාවලිය මිනිසා තුළදී යැපීමේ මාධ්‍යන් සඳහා වූ නිෂ්පාදනය බවට පත්වන්නේත් ඒ සඳහා වූ මිනිස් ක්‍රියාකාරීත්වය ශ්‍රමය ලෙසින් හඳුනාගැනීමට හැකි වන්නේ නිෂ්පාදනය සඳහා උපකරණ පාවිච්චිය ඇරඹීමත් සමඟය.

මානව පරිණාමය මාක්ස්වාදී දෘෂ්ටියකින් විග්‍රහ කළ පෙඩ්රික් එංගල්ස් "වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේදී ශ්‍රමය ඉටු කළ කාර්යය" නම් ලිපියේ ශ්‍රමය හා නිෂ්පාදන උපකරණවල ඇති සම්බන්ධය මෙසේ සඳහන් කර තිබේ. "ශ්‍රමය ආරම්භ වූයේ උපකරණ සෑදීමත් සමඟය. ප්‍රාග් ඓතිහාසික මිනිසුන් විසින් අපට දායාද කොට ගිය ආදිතම උපකරණය අනුවද ආදී ඓතිහාසික ජනතාවගේ ජීවන රටාව අනුවද එමෙන්ම සමකාලීන ම්ලේච්ඡයන්ගේ අවි අනුවද අපට සොයාගත හැකි ඉතාම ආදිකාලීන උපකරණ මොනවාද? ඒවා දඩයම් කිරීමේ හා මාළු බෑමේ උපකරණයන්ය. මේවා උපකරණ මෙන්ම අවි හැටියටද ගැණින." ඒ අනුව අපට පැහැදිලි වන්නේ නිෂ්පාදනය ශ්‍රමය ඒවායේ නියම අර්ථයෙන් ක්‍රියාත්මක වීම ඇරඹෙන්නේ නිෂ්පාදනය සඳහා උපකරණ භාවිතය ඇරඹීමත් සමඟ බවය. අපට තාක්‍ෂණය හමුවන්නේ මෙතැනදීය.

මානව වර්ගයාගේ ආරම්භයත් සමඟ නිෂ්පාදනය ආරම්භ වූයේ ආදිකාලීන මිනිසා ඉතාම නොදියුණු හෝ උපකරණ පාවිච්චි කිරීමත් සමඟය. විද්‍යාත්මක දැනුම පිළිබඳ සවිඥානික අවබෝධයක් නැති වුවද මෙය විද්‍යාව ලෙස හඳුනා නොගත්තද මුල්ම නිෂ්පාදන උපකරණ වන ගල් පතුරු, මුගුර, හෙල්ල, පොල්ල, ආදිය භාවිතා වෙද්දී ඒ තුළ විද්‍යාවක් තිබිණි. සතුන් දඩයම් කිරීමට, මාළු ඇල්ලීමට ඉහත ඉතා රළු ගොරහැඩි ප්‍රාථමික උපකරණ පාවිච්චි කරද්දී මුල්ම මානවයා නොදැන සිටියාට ඒ තුළ වූයේ පසු කලෙක අයිසෙක් නිවුටන් විසින් සොයාගත් භෞතික නියාමයක් වන "සෑම ක්‍රියාවකටමට සමාන වූද ප්‍රතිවිරුද්ධ වූද ප්‍රතික්‍රියාවක් තිබේ" යන සත්‍යයි. ඒ නිසාම මුල්ම නිෂ්පාදනය උපකරණ සරල හා ප්‍රාථමික වුවත් ඒවා තුළ සරල හා ප්‍රාථමික තාක්ෂණයක්ද තිබිණ. එබැවින් තාක්ෂණය උපදින්නේ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන උපකරණ සාදා ගැනීමත් ඒවා පාවිච්චි කිරීමත් සමඟ බව පැහැදිලිය. ඒ අනුව තාක්ෂණය බිහිවන්නේ මිනිසා බිහිවීමත් සමඟය.

එලෙස බිහි වූ තාක්ෂණය මානව සමාජයේ සංවර්ධනය සමඟ පරපුරෙන් පරපුරට අත්දැකීම් හා දැනුම එකතුකරගනිමින් වර්ධනය වූ අතර සමාජ ක්‍රමයෙන් සමාජ ක්‍රමයට පිම් පනිමින් ඉදිරියට ගියේය. මිනිසා තම ගමන් මඟ තුළ නිෂ්පාදන මාධ්‍යයන් පුළුල් කරගැනීමට සාපේක්ෂකව තාක්ෂණයද පුළුල් විය. වර්ධනය විය. මේ පිළිබඳව සිය කෘතියේ එංගල්ස් මෙසේ සඳහන් කර තිබේ. "අත්වලත් කතාකිරීමේ ඉන්ද්‍රියන්වලත් මොළයෙහි සංයුක්ත ක්‍රියාකාරීත්වය නිසා එක් මිනිසෙකුගේ පමණක් නොව සමාජයේද වඩ වඩාත් සියුම් ක්‍රියාකාරීත්වයන් සපුරාලීමට මිනිසා සමත් විය. වඩ වඩා උසස් පරමාර්ථයන් සඳහා වැඩ කිරීමට මිනිසාට හැකි විය. එක් එක් පරම්පරාවේ වැඩ, විවිධ, වඩාත් අංග සම්පූර්ණ හා වඩාත් නානාවිධ විය. දඩයම් කිරීම සත්ව පාලනයට ගොවිතැනද එකතු විය. ඊළඟට නූල් කැටීම, රෙදි විවීම, ලෝහ වැඩ, වළං සෑදීම, ගංගා සහ මුහුද තරණය ඇති විය. වෙළඳාම හා කර්මාන්තයන් සමඟ කලාව හා විද්‍යාව අවසානයේදී බිහි විය. ගෝත්‍ර, ජාතීන් සහ රාජ්‍යය බවට පරිවර්තනය විය." නිෂ්පාදනය සමඟ ජනතාවගේ ගමන් මඟ සාදා ඇත්තේ එසේය. එබැවින් තාක්ෂණය බිහිවීම මෙන්ම එහි වර්ධනය හා ගමන් මඟ අපට වටහාගත හැකි වන්නේ මානව නිෂ්පාදනයේ ආරම්භය එහි වර්ධනය හා එහි ගමන් මඟට සාපේක්ෂව හා ඊට සම්බන්ධයක් සහිතවය.

## කරක් ගහපු තැන



# මනං දියඇලි කුමාරිය

රත්නපුර දිස්ත්‍රික්කය හැඩ කරන සුන්දර යුවතියක් වූ මනං ඇල්ල චමත්කාරයෙන් සපිරි අපූරු දිය ඇල්ලකි. සම ශීතෝෂ්ණ දේශගුණයකට නෑකම් කියන කිරි ඇල්ලෙන් මනං ඇල්ල සොයා ගියේ වැස්ස ඇද හැලුණු පසු හමන සුලඟෙන්ද සිරුරට සීතල දැනෙන විටදීය. වැස්සත් සමඟම කබරගල ඇල්ල/කිරි ඇල්ල පණ නැගී තිබීම අපගේ ගමන වඩ වඩාත් උනන්දු කරවීය. ලද උපදෙස් අනුව පානදුර රත්නපුර මාර්ගයේ (A08) කිරි ඇල්ල පසු කර රත්නපුර දෙසට ගමන් කළේ කුරුගම්මෝදර හන්දිය සොයා ගැනීමටය. කිලෝමීටර් 04ක් පමණ ගිය තැන හමුවන කුරුගම්මෝදර මංසන්ධියට ඉහළින් රබර් යාය මැදින් වමට වැටී ඇති එල්ලාවල හරහා ඉඩංගොඩ මාර්ගයේ කිලෝමීටර 10ක් පමණ ගමන් කළේ පහලගම හමුවන තෙක්ය. ඒ ආසන්නයේ ඇති ලෑලි කපු කඩේ අසලින් දිවෙන කොන්ක්‍රීට් පාරේ ගමන් කළ විට දිය ඇල්ල නිර්මාණය කිරීමෙන් පසු නිසොල්මනේ ගලා බසිනා දිය දහරාව හමුවේ. ඉන් එගොඩ වී කුරුඳු කට්ටිය අසලින් වැටී ඇති අඩි පාරේ ගමන් කළ විට ඇල්ල හමුවේ.

පිට කන්දෙන් ඇරඹී ත්‍රිභංග ලීලාවෙන් කඩා හැලෙන දියඇල්ල සොබාදහමේ අපූර්ව නිර්මාණයකි. මධ්‍යම ප්‍රමාණයේ දියඇල්ලක් වන මනං ඇල්ල සබරගමුවේ පිහිටි දුනුමාල ඇල්ල සිහි ගන්වයි. වැසි සමයේදී චමත්කාරජනක ලෙස ඇද හැලෙන මනාලිය අවට පරිසරය පිනිබිඳුවලින් වසා ගන්නේ සිය සුන්දරත්වය හාත්පසටම විහිදාලමින්ය. සිරිපොද හා සමාන පිනිපොද ගතට නැවුම් බවක් ඇති කරයි. ක්ෂීර දහරාවක් සේ ඇද හැලෙන දිය පහර දෙස නෙත් යොමා බලා සිටින ඕනෑම අයෙකු වශීකෘත වනු නොඅනුමානය. සිත ඒකාත්මික වේ. මනං යනුවෙන් හඳුන්වනු ලැබූ කාන්තාවක් ඇල්ල ආසන්නයෙන් එතෙර වීමට ගොස් දියේ ගිලී මියගිය හෙයින් මේ දියඇල්ලට මනං යන නම පට බැඳී ඇති බව ජනප්‍රවාදගතය. ගලා යන දිය පහරේ ආරක්ෂිතව දිය නෑමට හැකිවන අයුරින් ස්වාභාවිකවම සැකසී ඇත. ගම්වාසීන් බොහෝ විට ස්නානයටත් රෙදි සේදීමටත් පැමිණෙන්නේ මේ ස්ථානයටය.

] ගයාන් තුදුස්ක [

## වස කනවද? එරෙහි වෙනවද?




රට පුරා විෂ සහිත ආහාර වෙළඳපොළ තුළ ඇති බවට, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්වරිය විසින් සිදුකළ ප්‍රකාශය නිසා ජනතාව අතර බරපතල අවිශ්වාසයක් ඇති වී තිබේ. එම නිසා මේ පිළිබඳව වත්මන් ආණ්ඩුව විසින් වහා රටට ඇත්ත හෙළිකළ යුතු බවට බල කරමින් සමාජවාදී තරුණ සංගමය විසින් අද අප්‍රේල් 09 වන දින 'වස කනවද? එරෙහි වෙනවද?' නමින් විරෝධතාවයක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඉදිරිපිට දී සිදුකරන ලදී. එහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, ජාතික කමිටු සාමාජික අංජන සම්පත් අමරසිංහ යන අය විසින් අදහස් පලකළ අතර එයට තරුණ සංගමයේ සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් සහභාගි විය...

## විමසුමට ලක්කළ දහයියාගල රක්ෂිත විනාශය



මේ වන විට රට පුරා දිගින් දිගටම සිදුවන පරිසර හානි සම්බන්ධයෙන් සොයා බලා ඒ පිළිබඳව රට හමුවේ තැබීම සමාජවාදී තරුණ සංගමය විසින් සිදු කරමින් සිටී. තණමල්විල දහයියාගල රක්ෂිතය තුළ සිදුවන පරිසර විනාශය පිළිබඳව යළිත් සොයා බැලීම සඳහා මාර්තු 25 වන දින සමාජවාදී තරුණ සංගමයේ සාමාජිකයන් පිරිසක් එහි ගියහ. ඒ වන විටද යළිත් වරක් එම ප්‍රදේශ ඩෝසර් කරමින් විශාල පරිසර හානියක් සිදුකරමින් ඇත. උමා ඔය ව්‍යාපෘතියට අදාල බැම්මක් ඉදිකිරීම සඳහා පස් කැපීම සිදු කරන ස්ථානයක් හා කොළඹ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු විසින් හෝටලයක් ඉදිකිරීමේ අරමුණෙන් ඉදිකෙරෙන ගොඩනැගීමක්ද එහිදි දක්නට ලැබිණි.

## රැකියා විරහිත උපාධිධාරීන්ට පොලිස් ප්‍රහාරයක්



රැකියා විරහිත උපාධිධාරී ඒකාබද්ධ මධ්‍යස්ථානය අප්‍රේල් 22 ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිටදී විරෝධතාවයක් පැවැත් විය. එහිදී පොලීසිය විසින් විරෝධතාවේ යෙදී සිටි සහෝදර සහෝදරියන්ට පහර දෙන ලදී. කෙසේ වෙතත් දිගින් දිගටම අරගලය අත්නොහැර සිටි අතර අවසානයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් ලබා දුනි. එහිදී උපාධිධාරීන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඇතුලත් සංදේශයක් ජනාධිපති ලේකම් කාර්යාලය යොමු කරන ලදී.

## කලු සුදු හොරු - තව පෙරළමුද එකම කාසිය?



කලු සුදු හොරු - තව පෙරළමුද එකම කාසිය? යන තේමාව ඔස්සේ අලුත් පියාපත් සංවිධානය විසින් සංවිධානය කරන ලද නිර්මාණාත්මක විරෝධතාවයක් අප්‍රේල් 02 වන දින පස්වරුවේ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී පැවැත්විණ. පසුගිය යහපාලන ආණ්ඩුවේ බැඳුම්කර වංචාව විසින් රටට අහිමි කළ රුපියල් බිලියන 11ක සහ වර්තමාන ආණ්ඩුවේ සීනි බදු වංචාව මඟින් රටට අහිමි කළ රුපියල් බිලියන 16ක මුදල පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගත් මෙම නිර්මාණාත්මක විරෝධතාවය සුවිශේෂී අංග කිහිපයකින් යුතු විය. මුළුතැන්ගෙයි භාණ්ඩ සහ බෙර යොදාගෙන සිදු කළ සංගීතමය අත්දැකීම, මෙම වංචාවන් දෙක පිළිබඳ සඳහන් ලීවලින් නිර්මාණය කරන ලද කාසියක් බෙදා හැරීම, performance art සහ රැස්ව සිටි පිරිස අතරින් තම විරෝධය පළ කිරීමට අවැසි ජනතාවට අදහස් පළ කිරීමට ඉඩදීමද එහිදී සිදුවිය.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.